# වාර්ෂික වාර්තාව
# 2012

## ජාතික අධ්‍යාපන ආයතනය
## මහරගම

# ප්‍රගති වාර්තාව - 2012

## 1.0 හැඳින්වීම

1985 අංක 28 දරණ පාර්ලිමේන්තු පනත අනුව පහත සඳහන් අරමුණු ඉටුකරලීමේ බලය ජාතික අධ්‍යාපන ආයතනයට පවරා ඇත,

(අ) ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සංවර්ධනය කිරීම සඳහා වූ සැලසුම්, වැඩ සටහන් සහ කටයුතු පිළිබඳව අමාත්‍යවරයාට උපදෙස් දීම;

(ආ) විවිධ විශේෂිත අධ්‍යාපන විෂයයන් හි ලා පශ්චාත් උපාධි අධ්‍යාපනය සැලසීම හා එය ප්‍රවර්ධනය කිරීම;

(ඇ) අධ්‍යාපන පද්ධතියෙහි කාර්ය සාධනය, අරමුණු, ව්‍යුහ, විෂය ප්‍රමාණය සහ විධි විද්‍යාව ද ඇතුළුව අධ්‍යාපන ක්‍රමය පිළිබඳව සහ අධ්‍යාපනයේ සමාජමය, ආර්ථික සහ වෙනත් අංශ පිළිබඳව අධ්‍යයනයක් පවත්වාගෙන යාම සහ ප්‍රවර්ධනය කිරීම;

(ඈ) අධ්‍යාපනික කාර්ය සඳහා කාර්මික ඥානය අනුවර්තනය කිරීම ද ඇතුළුව අධ්‍යාපන පද්ධතියේ නවීකරණ ක්‍රියාවලියන් ආරම්භ කිරීම සහ ප්‍රවර්ධනය කිරීම;

(ඉ) අධ්‍යාපන පද්ධතියෙහි නියැලි කාර්ය මණ්ඩලයේ වෘත්තීය සහ කළමනාකරණමය නිපුණත්වය වැඩි දියුණු කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම;

(ඊ) රජයට සහ වෙනත් අනුමත සංවිධානවල අධ්‍යාපනය පිළිබඳ විශේෂඥ සේවා ලබාදීම;

(උ) අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද අධ්‍යාපන සංවර්ධනය වැඩ සටහන් කරගෙන යාම; සහ

(ඌ) සමාන අරමුණු ඇති වෙනත් ආයතන සමග සම්බන්ධීකරණය විම.

ඒ අනුව දේශීය හා ගෝලීය ඉල්ලුමට සරිලන ඵලදායී පුරවැසියන් බිහි කිරීම සඳහා ඉවහල් වන විෂයමාලාවක් මගින් අධ්‍යාපනයේ ගුණාත්මක බව සහතික කිරීමේ ද, පාසල් පද්ධතියට අවශ්‍ය නිපුණතා පූර්ණ වෘත්තිකයන් පිරිසක් නිර්මාණය කරනු සඳහා නායකත්වය සැපයීමේ ද, අධ්‍යාපන සංවර්ධනය ඉලක්ක කර ගත් ප්‍රතිපත්ති සම්පාදනය සුසාධ්‍ය කිරීමට හා ඊට මග පෙන්වනු පිණිස විද්‍යාත්මක තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීමේ ද වගකීම ජාතික අධ්‍යාපන ආයතනයට පැවරී ඇත.

පාසල් විෂයමාලාව අරභයා 2012 වර්ෂයේ අවධානය මූලික වශයෙන් ම නාභිගත කරන ලද්දේ 2015 වර්ෂයේ දී යාවත්කාලීන විෂයමාලාවක් පාසල්වල ක්‍රියාත්මක කරනු වස් පවත්නා විෂයමාලාව විචාරවත් කරනු පිණිස ස්ථාවර පදනමක් දැමීම කෙරෙහි ය. අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන හඳුන්වා දීමෙන් අනතුරු ව පාසල් විෂයමාලාව හා සම්බන්ධ කටයුතු සඳහා අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදන ප්‍රධාන කොට ම ආවරණය කර ගන්නා ලද්දේ වර්තමානයේ " පාසල් අධ්‍යාපන පද්ධතිය දැනුම් කේන්ද්‍රයක පදනම බවට පරිවර්තන කිරීමේ ව්‍යාපෘතිය" (TSEP) යනුවෙන් හැඳින්වෙන, අධ්‍යාපන ආංශික සංවර්ධන ප්‍රතිපාදන (ESDG) හා එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලෙහි (UNICEF) ප්‍රතිපාදන මගිනි. එහෙත් යථෝක්ත ප්‍රතිපාදන ආයතනයට ලැබීම 2012 වර්ෂයේ ජූනි මස අවසානය වන තෙක් ප්‍රමාද වීම නිසා මේ කාලසීමාව සඳහා සැලසුම් කරන ලද ක්‍රියාකාරකම්වල යම් පමණක පසුබෑමක් දක්නට ලැබුණේ වී නමුදු, ආයතනික ඉපයීම්වලින් රුපියල් මිලියන 10 ක මුදලක් නැවත ප්‍රතිපූරණය කිරීමේ පදනම මත යොදා ගනිමින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් විෂයමාලා සංවර්ධන ක්‍රියාකාරකම්වලින් බහුතරයක් ආයතනය විසින් ඉටු කරනු ලැබිණ. ඒ සමග ම, ඔක්තෝම්බර් මාසයේ දී අපේක්ෂිත ප්‍රතිපාදන ලැබුණු විගස ආයතනයේ කටයුතු යථා තත්ත්වයට පත් කිරීමට අවශ්‍ය විධිවිධාන සලසා තිබුණි.

මේ වර්ෂය ඇතුළත දී ගුරුවරුන්, විදුහල්පතිවරුන් හා අධ්‍යාපන පරිපාලකයන් ඇතුළු 10,185 ක දේශීය හා විදේශීය වෘත්තිකයන් පිරිසක් ආයතනය විසින් පවත්වනු ලැබූ විවිධ පාඨමාලා හැදෑරීමෙහි නියුක්ත ව සිටියහ. ඒ තුළින් ආයතනයේ පිරිවැයෙන් සැලකිය යුතු කොටසක් පියවා ගැනීමට ද ආයතනයට හැකි විය. අධ්‍යාපන අමාත්‍යවරයාගේ මූලික මැදිහත් වීම මත කලාපයේ ගුරුවරුන් හට විවිධ වෘත්තීය සංවර්ධන පාඨමාලා, වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහා යුනෙස්කෝ ලාංඡනය යටතේ ක්‍රියාත්මක වීමට අනුග්‍රහය ලද "දකුණු ආසියා කලාපීය ගුරු සංවර්ධන මධ්‍යස්ථානය" ජාතික අධ්‍යාපන ආයතනයේ මීපේ පරිශ්‍රයෙහි ස්ථාපනය කිරීමට ලැබීම, අධ්‍යාපන ප්‍රජාවගේ වෘත්තීය සංවර්ධනය පිළිබඳ වගකීම් දරන ජාතික අධ්‍යාපන ආයතනය ලැබූ විශිෂ්ට ජයග්‍රහණයකි.

අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ඉවහල් වන පර්යේෂණ කිරීමේත් අධ්‍යාපන පර්යේෂණ ක්‍රියාත්මක කිරීම සඳහා මග පෙන්වන්නකු ලෙසත් ක්‍රියාත්මක වන අධ්‍යාපන පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව, නව විෂයමාලා ප්‍රතිපත්ති ලේඛනයක් සකස් කිරීම සඳහා පවත්නා විෂයමාලා ප්‍රතිපත්ති ලේඛන සමාලෝචනය කිරීමෙහි නිරත ව සිටියේය.

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් යථෝක්ත ක්‍රියාකාරකම්වලට අතිරේක ව, ජාතික අධ්‍යාපන ආයතනය උර දුන් විශේෂ කටයුතු නම් පාසල් පාදක ඇගයීම සඳහා උපකරණ කට්ටල පිළියෙල කිරීම, ජනාධිපති කාර්යසාධක බලකාය විසින් ක්‍රියාත්මක කරන ලද " ජීවන නිපුණතාවක් ලෙස ඉංග්‍රීසි " වැඩසටහන සඳහා D V D ඉගෙනුම් උපකරණ සැකසීම, " තිරසාර සංවර්ධනය සඳහා අධ්‍යාපනය" වැඩසටහනට අදාළ ක්‍රියාකාරකම් හා යුනෙස්කෝ අනුග්‍රහයෙන් ක්‍රියාවට නංවන ලද " විද්‍යා අත්හුරු ද්විතීයික අධ්‍යාපන වැඩසටහන" ය.

## 2.0 ජාතික අධ්‍යාපන ආයතන සංවිධාන ව්‍යුහය

### 2.1 ආයතන සභාව - 2012

ජාතික අධ්‍යාපන ආයතන පනත මගින් එහි ආයතන සභාව වෙත පහත සඳහන් බලතල පැවරී ඇතː

- ව්‍යවස්ථාවෙන් නියම කරන ලද බඳවා ගැනීමේ පටිපාටි හා පත් කිරීම් සම්බන්ධ ක්‍රියා පිළිවෙලට අනුව ආයතනයේ කාර්ය මණ්ඩලය පත් කිරීම;
- ආයතනයේ කාර්ය මණ්ඩල සේවා සම්බන්ධ නියමයන් සහ කොන්දේසි, වැටුප්, වේතන හා අනෙකුත් පාරිතෝෂික ඇතුළු කාර්ය මණ්ඩල සේවා ගෙවීම් සම්බන්ධ නිති රීති තීරණය කිරීම;
- ආයතනයේ විනය සම්බන්ධ නීති රීති සම්පාදනය කිරීම;
- ආයතන කාර්ය මණ්ඩල ප්‍රතිලාභ හා අර්ථ සාධක ගෙවීම් සම්බන්ධ අරමුදල් ස්ථාපිත කිරීම හා විධමත් කිරීම.

ජාතික අධ්‍යාපන ආයතන පනතට අනුව ආයතනය සම්බන්ධ මූල්‍ය හා පරිපාලන බලතල පැවරී ඇත්තේ ආයතන සභාවට ය. 2012 වසරේ ආයතන සභාව සමන්විත වූයේ පහත දැක්වෙන සාමාජිකයන්ගෙනි.

| | | |
|---|---|---|
| *එස්.එම්. ගෝඨාභය ජයරත්න මහතා* | - | *සභාපති* |
| *(ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය)* | | |
| *මහාචාර්ය ඩබ්ලිව්.එම්.අබේරත්න බණ්ඩාර මහතා* | - | *සාමාජික* |
| *(අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය)* | | |
| *මහාචාර්ය එස්.සන්දරසේගරම් මහතා* | - | *සාමාජික* |
| *(හිටපු පීඨාධිපති, අධ්‍යාපන පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය)* | | |
| *මහාචාර්ය අර්ජුන ද සිල්වා මහතා* | - | *සාමාජික* |
| *(අධ්‍යක්ෂ ජනරාල්, ක්‍රීඩා හා විද්‍යා ආයතනය)* | | |
| *මහාචාර්ය මුදියන්සේ දිසානායක මහතා* | - | *සාමාජික* |
| *(ජ්‍යෙෂ්ඨ මහාචාර්ය/ අධ්‍යක්ෂ, දෘෂ්‍ය හා ප්‍රාසාංගික කලා විශ්වවිද්‍යාලය)* | | |
| *මහාචාර්ය රෝලන්ඩ් අබේපාල මහතා* | - | *සාමාජික* |
| *(අධ්‍යාපන පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය)* | | |
| *ආචාර්ය ටී.ඒ.පියසිරි මහතා* | - | *සාමාජික* |
| *(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, යාන්ත්‍රික ඉංජිනේරු දෙපාර්තමේන්තුව, මොරටුව විශ්වවිද්‍යාලය)* | | |
| *මංජුල මාකුඹුර මහතා* | - | *සාමාජික* |
| *(නීතිඥ)* | | |
| *ආර්.උඩුවාවල මහතා* | - | *සාමාජික* |
| *(අධ්‍යක්ෂ, ජාතික අයවැය දෙපාර්තමේන්තුව)* | | |
| *පී. රනේපුර මහතා* | - | *සාමාජික* |
| *(අතිරේක ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය)* | | |
| *වෛද්‍ය සාරංග අලහප්පෙරුම මහතා* | - | *සාමාජික* |
| *(මූලික රෝහල, කිරිබත්ගොඩ)* | | |
| *වී.සි.ඩී.පී.පෙරේරා මිය* | - | *ආයතන සභා ලේකම්* |
| *(ප්‍රධාන ව්‍යාපෘති නිලධාරි, ඉංග්‍රීසි දෙපාර්තමේන්තුව, ජා.අ.ආ)* | | |

## 2.2 ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය - 2012

ආයතන සභාවට අමතර ව ආයතනයේ සියලු ම ශාස්ත්‍රීය කටයුතු සම්බන්ධයෙන් උපදෙස් දීමට අධ්‍යාපන, කළමනාකරණ, පරිපාලන හා වෙනත් ක්ෂේත්‍රවල ප්‍රවීණත්වයක් ඇති විද්වතුන්ගෙන් සමන්විත ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයක් පත් වන අතර, එමගින් ආයතනයේ පහත දැක්වෙන ශාස්ත්‍රීය කාර්ය හා සම්බන්ධයෙන් අධ්‍යාපනික නායකත්වය, සුපරීක්ෂණය සහ උපදේශනය ලබා දෙයි.

- සියලු ම ශාස්ත්‍රීය කාර්යවල දී ආයතන සභාවට උපදෙස් සැපයීම;
- ශාස්ත්‍රීය කටයුතු සම්බන්ධ ව ආයතන සභාව විසින් පවරන ලද කටයුතු සම්බන්ධයෙන් කරුණු සමාලෝචනය කොට වාර්තා කිරීම;

- ආයතනය විසින් පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලා, පුහුණු වැඩසටහන් සහ විභාග පිළිබඳ නිර්දේශ ආයතන සභාවට ඉදිරිපත් කිරීම;
- ආයතනය විසින් පවත්වනු ලබන අධ්‍යාපන පාඨමාලා, පුහුණු වැඩසටහන් හා විභාග සඳහා සිසුන් බඳවා ගැනීම පිළිබඳ නිර්දේශ ආයතන සභාවට ඉදිරිපත් කිරීම;
- ආයතනය විසින් පවත්වනු ලබන පාඨමාලා, පුහුණු වැඩසටහන් හෝ විභාග වලට අදාළ නීති රීති සම්පාදනය කිරීම හා ඒවා ආයතන සභාවට ඉදිරිපත් කිරීම;
- ආයතනය විසින් පවත්වනු ලබන විභාගවල දී විභාග පරීක්ෂකවරුන් වශයෙන් පත් කිරීමට සුදුසු අයගේ නම් ආයතන සභාවට නිර්දේශ කිරීම;
- ශාස්ත්‍රීය කාර්ය හා සම්බන්ධ ශිෂ්‍යත්ව, පදක්කම් සහ ත්‍යාග ප්‍රදාන පිළිබඳ නීතිරීති සහ ඒවායේ ස්වභාවය පිළිබඳ ව ආයතන සභාවට නිර්දේශ කිරීම;
- ආයතන සභාව මඟින් අනුමත කොන්දේසි සම්පූර්ණ කරන ලද පුද්ගලයන් සඳහා ශිෂ්‍යත්ව, පදක්කම් සහ ත්‍යාග ප්‍රදානය කිරීම හා
- ආයතන සභාවේ අනුමැතිය ඇතිව විවිධ කමිටු සඳහා ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයට ඇතුළත් වන අය මෙන්ම ඉන් පරිබාහිර පුද්ගලයන් පත් කිරීම;

2012 වසරේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය සමන්විත වූයේ පහත දැක්වෙන විද්වතුන්ගෙනි.

| | | |
|---|---|---|
| *මහාචාර්ය ඩබ්ලිව්. ආරියදාස ද සිල්වා මහතා* | - | *සභාපති* |
| *(හිටපු පීඨාධිපති, අධ්‍යාපන පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය)* | | |
| *මහාචාර්ය ඩබ්ලිව්.එම්.අබේරත්න බණ්ඩාර මහතා* | - | *සාමාජික* |
| *(අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය)* | | |
| *මහාචාර්ය එස්.විදානපතිරණ මහතා* | - | *සාමාජික* |
| *(සේවා සම්මත මහාචාර්ය, ක්ෂුද්‍ර ජීව විද්‍යා දෙපාර්තමේන්තුව, කැලණිය විශ්ව විද්‍යාලය)* | | |
| *මහාචාර්ය නාරද වර්ණසූරිය මහතා* | - | *සාමාජික* |
| *(හිටපු උපකුලපති, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය)* | | |
| *ආර්.එස්.මැදගම මහතා* | - | *සාමාජික* |
| *(විශ්‍රාමික අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා ක්‍රියාත්මක කිරීමේ ඒකකය)* | | |
| *ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්ප කුමාර මහතා* | - | *සාමාජික* |
| *(විභාග කොමසාරිස් ජනරාල්, විභාග දොපර්තමේන්තුව)* | | |
| *තිස්ස නන්දසේන මහතා* | - | *සාමාජික* |
| *(ලේකම්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම)* | | |
| *තිස්ස හේවාවිතාරණ මහතා* | - | *සාමාජික* |
| *(කොමසාරිස් ජනරාල්, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව)* | | |
| *මහාචාර්ය පී.සී.ජවුෆර් මහතා* | - | *සාමාජික* |
| *(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, අධ්‍යාපන පීඨය, විවෘත විශ්වවිද්‍යාලය* | | |

*ඩබ්.පී.ආර්. සිල්වා මිය - සාමාජික*
*(වැ.බ.ප්‍රධාන කොමසාරිස්, ගුරු අධ්‍යාපන, අධ්‍යාපන අමාත්‍යංශය)*
*ආචාර්ය ටී.ඒ.ආර්.ජේ. ගුණසේකර මිය - සාමාජික*
*(ස.අ.ජ./ සැලසුම් හා පර්යේෂණ පීඨය, ජා.අ.ආ)*
*අයි.එම්.කේ.බී.ඉලංගසිංහ මහතා - සාමාජික*
*(ස.අ.ජ./අධ්‍යාපන නායකත්ව සංවර්ධන කළමනාකරණ පීඨය,*
*ජාතික අධ්‍යාපන ආයතනය)*
*ආචාර්ය ජී.කොඩිතුවක්කු මහතා - සාමාජික*
*(ස.අ.ජ., (වැ.බ.) භාෂා, මානව ශාස්ත්‍ර හා*
*සමාජ විද්‍යා පීඨය, ජාතික අධ්‍යාපන ආයතනය)*
*එස්.එෆ්.එස්.පී. ජයවර්ධන මහතා - සාමාජික*
*(ස.අ.ජ. /විද්‍යා හා තාක්ෂණ පීඨය)*
*වී.සී.ඩී.පී. පෙරේරා මිය - ශාස්ත්‍රීය කටයුතු*
*(ප්‍රධාන ව්‍යාපෘති නිලධාරි, ඉංග්‍රීසි දෙපාර්තමේන්තුව) මණ්ඩල ලේකම්*

### 2.3 අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය

අධ්‍යක්ෂ ජනරාල් ලේකම් කාර්යාලය හා අභ්‍යන්තර විගණන අංශය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ. අධ්‍යක්ෂ ජනරාල් ලේකම් කාර්යාලය මගින් 2012 වසරේ දී ආයතන සභා රැස්වීම් 13 ක් ශාස්ත්‍රීය කටයුතු මණ්ඩල රැස්වීම් 12ක් හා ඒකාබද්ධ රැස්වීමක් සම්බන්ධීකරණය කොට තිබේ.

2012 වසරේ දී ද ආයතනයේ අභ්‍යන්තර පරිපාලන ව්‍යුහය ශක්තිමත් කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශය මගින් කාර්යක්ෂම විගණන සේවාවක් පවත්වා ගෙන යන ලදී.

### 2.4 පීඨ / අංශ

2012 වර්ෂයෙහි ආයතනයේ සංවිධාන ව්‍යුහය පහත සඳහන් එක් එක් පීඨ සහ අංශ යටතේ ක්‍රියාත්මක විය.

#### 2.4.1 භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
සිංහල දෙපාර්තමේන්තුව
දෙමළ දෙපාර්තමේන්තුව
ඉංග්‍රීසි දෙපාර්තමේන්තුව
සෞන්දර්ය දෙපාර්තමේන්තුව
ආගම් දෙපාර්තමේන්තුව
සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව

### 2.4.2 විද්‍යා හා තාක්ෂණ පීඨය

විද්‍යා දෙපාර්තමේන්තුව

ගණිත දෙපාර්තමේන්තුව

තාක්ෂණික අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ව්‍යාපාර අධ්‍යයන දෙපාර්තමේන්තුව

තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව

සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන ඒකකය

### 2.4.3 සැලසුම්, පර්යේෂණ හා ගුරු අධ්‍යාපන පීඨය

සැලසුම් හා ඇගයීම් දෙපාර්තමේන්තුව

පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව

ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ආයතනික සංවර්ධන දෙපාර්තමේන්තුව

බාහිර සබඳතා කළමනාකරණ ඒකකය

### 2.4.4 අධ්‍යාපන නායකත්ව සංවර්ධන කළමනාකරණ පීඨය

වෘත්තීය සංවර්ධන සහ අධ්‍යාපන කළමනාකරණ දෙපාර්තමේන්තුව

අධ්‍යාපන පරිපාලන හා සංවර්ධන දෙපාර්තමේන්තුව

විදේශීය පාඨමාලා ඒකකය

### 2.4.5 විකල්ප අධ්‍යාපන පීඨය

අන්තර්කරණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව

මුද්‍රණ හා ප්‍රකාශන දෙපාර්තමේන්තුව

සම්භාව්‍ය, විදේශීය භාෂා හා ද්විභාෂා අධ්‍යාපන දෙපාර්තමේන්තුව

විද්‍යුත් ප්‍රචාරණ දෙපාර්තමේන්තුව

මාර්ගෝපදේශන හා උපදේශන ඒකකය

විවෘත පාසල් ඒකකය

### 2.4.6 පරිපාලන, මූල්‍ය හා සහාය සේවා අංශය

පරිපාලන දෙපාර්තමේන්තුව

මුදල් දෙපාර්තමේන්තුව

ඉංජිනේරු හා නඩත්තු සේවා දෙපාර්තමේන්තුව

පුස්තකාල දෙපාර්තමේන්තුව

## 3.0 2012 වර්ෂයේ විශේෂ සිදුවීම්

- ආයතනයේ අභ්‍යන්තර කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා ඉවහල් වන පිළිවෙත් හඳුන්වා දෙන ලදි. මැලේසියාවේ මලයා විශ්ව විද්‍යාලය හා ජාතික අධ්‍යාපන ආයතනය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කළ අතර, ඒ මඟින් ජාතික අධ්‍යාපන ආයතනයේ නිලධාරීන් හට ආචාර්ය

උපාධි හා වෙනත් පශ්චාත් උපාධි පාඨමාලා සහන කොන්දේසි මත ලබා ගැනීමට පහසුකම් සැලසී ඇත. ඒ යටතේ ඉදිරියේ දී ශිෂ්‍ය හුවමාරු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට ද නියමිත ය.

- ජාතික අධ්‍යාපන ආයතනයේ විභාග පටිපාටිය කාර්යක්ෂම ලෙස ඉටු කරනු පිණිස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරියකු ද්වීතීයන පදනම යටතේ ආයතනයට අනුයුක්ත කරවා ගැනීම.

- අවුරුදු හයක් තිස්සේ ප්‍රමාද වුණු ජාතික අධ්‍යාපන ආයතනයේ උපාධි ප්‍රදානෝත්සවය පැවැත්වීම හා අධ්‍යාපනපති සහ අධ්‍යාපනවේදී උපාධිධාරීන් හා පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමාධාරීන් (මාලදිවයින් සිසුන් ද ඇතුළත්ව ) 1263 දෙනෙකු සඳහා සහතික පත්‍ර ප්‍රදානය කිරීම.

- විවිධ හේතු මත වසර කිපයක් තිස්සේ ප්‍රමාද වී තිබූ ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා සහතික පත්‍ර ප්‍රදානය සඳහා අවශ්‍ය කටයුතු කිරීම.

- ආයතනය සතු පරිගණක යන්ත්‍ර වඩාත් ඵලදායී ලෙස පරිහරණය කරනු සඳහා පහත දැක්වෙන පියවර ක්‍රියාත්මක කිරීම.
  - ජාතික අධ්‍යාපන ආයතන කාර්ය මණ්ඩලයට ඉහළ මට්ටමේ පරිගණක පුහුණුවක් ලබා දීමට කටයුතු කිරීම.
  - දෙපාර්තමේන්තු අවශ්‍යතා අනුව පරිගණක භාවිතය ප්‍රතිසංවිධානය කිරීම.
  - අවශ්‍ය ප්‍රතිකාරක කටයුතු සඳහා පරිගණක භාවිතය කාලාන්තරික ව සමාලෝචනයට භාජනය කිරීම.
  - ආයතනය තුළ හුවමාරු වන ලිපි ලේඛන විද්‍යුත් මාර්ගික ව ඉටු කිරීම මගින් ආයතනය තුළ තොරතුරු තාක්ෂණ සංස්කෘතියක් ස්ථාපිත කිරීම.
  - ජාතික අධ්‍යාපන ආයතන කාර්ය මණ්ඩලයට පොදු පරිගණක පහසුකම් සපයා ගැනීම සඳහා ස්ථානයක් පිහිටුවීම.

- පහත දැක්වෙන ක්‍රියාකාරකම් මගින් අධ්‍යාපනයට අනුබද්ධ පිරිස්වල පර්යේෂණ කුසලතා ප්‍රවර්ධනය සඳහා අවස්ථා සම්පාදනය කිරීම.
  - පර්යේෂණ ක්‍රම පිළිබඳ තෙදින තේමා පාදක පාඨමාලාවක් මීපේ මධ්‍යස්ථානයේ පැවැත්වීම.
  - පර්යේෂණ අනාවරණ ප්‍රචලිත කිරීම සඳහා 2012 මාර්තු මාසයේ දී දෙදින සම්මන්ත්‍රණයක් පැවැත්වීම. මෙහි දී අධ්‍යාපන පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් හා ජාතික අධ්‍යාපන ආයතනයේ කාර්ය මණ්ඩල සාමාජිකයන් විසින් මෙන්ම විශ්වවිද්‍යාල ආචාර්ය මණ්ඩල සාමාජිකයන් හා පාසල්වල විදුහල්පතිවරුන් වැනි බාහිර පර්යේෂකයන් විසින් ද කරන ලද පර්යේෂණවල අනාවරණ සාකච්ඡා කෙරිණ.

- අධ්‍යාපන අමාත්‍යාංශයේ " දැනුමැති සමාජයක් සඳහා අධ්‍යාපනය" (EKSP) ව්‍යාපෘතියේ අධ්‍යාපන කළමනාකරණ විශේෂඥ ආචාර්ය රිචඩ් ගොන්සාලේස් විසින් "පර්යේෂණ කුසලතා හා ඵලදායිතා ප්‍රවර්ධනය" යන මැයෙන් දෙදින සම්මන්ත්‍රණයක් පැවැත්වීම.

- ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් මෙහෙයවන පූර්වෝක්ත "ජීවන නිපුණතාවක් ලෙස ඉංග්‍රීසි" වැඩසටහන සඳහා DVD 550 ක් සම්පාදනය කිරීමේ වගකීම භාර ගෙන ඒ යටතේ අ.පො.ස. (සා.පෙළ) ඉංග්‍රීසි භාෂාව සඳහා DVD 50 ක් ද, 10 ශ්‍රේණියේ ඉංග්‍රීසි භාෂාව සඳහා වීඩියෝ පිටපත් 50ක් ද පිළියෙල කර අවසන් කිරීම.

- යුනෙස්කෝ ආයතනයේ ප්‍රතිපාදන යටතේ ජාතික ගුරු පුහුණු ආයතනවල භාවිතය සඳහා "තිරසාර සංවර්ධනය සඳහා අධ්‍යාපනය " පිළිබඳ පුහුණු අත්පොතක් පිළියෙල කිරීම හා ද්විතීයික පාසල්වල විද්‍යා අත්හුරුව සුසාධ්‍ය කරනු වස් අඩු මිල විද්‍යා කට්ටල සංවර්ධනය කිරීම.

- ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන දැනුමැති සමාජයක් සඳහා අධ්‍යාපනය (EKSP) ව්‍යාපෘති ආධාර යටතේ 6 ශ්‍රේණියේ සිට 9 ශ්‍රේණිය දක්වා පාසල් පද්ධතියේ සෑම විෂයයක් සඳහා ම පාසල් පාදක ඇගයීම් සඳහා උපකරණ කට්ටල සැකසීම ආරම්භ කිරීම. ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යාපන නායකත්ව සංවර්ධන මධ්‍යස්ථානයේ දී විදුහල්පතිවරුන් 1810 දෙනෙකු සඳහා පස්දින විදුහල්පති පාඨමාලාවක් ක්‍රියාත්මක කිරීම.

- පාසල් සඳහා විද්‍යුත් - ඉගෙනුම (e-learning) හඳුන්වා දීම යටතේ අ.පො.ස. (උ.පෙ.) විද්‍යාව, ආහාර තාක්ෂණය හා ගිණුම්කරණය විෂයයන්හි ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා ඉගෙනුම් ද්‍රව්‍ය 10ක් හඳුනා ගෙන උඩුගත කොට ඇත.

- ශ්‍රී ලංකා ගුවන් හමුදා නිලධාරීන්ගේ පුහුණු හැකියා වර්ධනය සඳහා පාඨමාලාවක් ආයතනයේ නිලධාරීන් විසින් ස්වෙච්ඡා පදනම යටතේ ක්‍රියාත්මක කිරීම. මේ යටතේ නිලධාරීන් 80 ක් සඳහා අධ්‍යාපන මනෝවිද්‍යාව හා උපදේශනය පිළිබඳ පුහුණුවක්ලබා දෙන ලදී.

- අධ්‍යාපන අමාත්‍යාංශය, වාණිජ විවිධ නීතිගත සංස්ථාව හා එටිසලාට් ආයතනය එක්ව ක්‍රියාත්මක කරන ඒකාබද්ධ ව්‍යාපෘතියක් වන " වෙබ් පාඨශාලා " මගින් ප්‍රචාරය කෙරෙන ඉගෙනුම් ද්‍රව්‍යවල ගුණාත්මක වර්ධනය සඳහා දායක වීම.

## 4.0 විෂයමාලා සංවර්ධනය

ජාතික අධ්‍යාපන ආයතනයේ විෂයමාලා සංවර්ධන කටයුතු ඉටු කරනු ලබන්නේ භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය සහ විද්‍යා හා තාක්ෂණ යන පීඨ මගිනි.
විෂයමාලා සම්පාදනය සඳහා ආයතනයට හිමි පහත සඳහන් බලතල යටතේ භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයට අයත් දොපර්තමේන්තු 7 සහ ද්විභාෂා ඒකකයක් විද්‍යා හා තාක්ෂණ පීඨයට අයත් දෙපාර්තමේන්තු 5ක් මගින් 2012 වර්ෂයේ දී විෂයමාලා සංවර්ධනය හා සම්බන්ධ ව්‍යාපෘති හැට අටක් ක්‍රියාත්මක කරන ලදී.

- සමාජ, සංස්කෘතික, ආර්ථික සහ තාක්ෂණික අවශ්‍යතාවලට ගැළපෙන පරිදි විෂයමාලා සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම, පුනරීක්ෂණ සහ සංශෝධන කටයුතු කිරීම.
- විෂයමාලා නවීකරණ හා සමග ම අර්ථවත් ප්‍රායෝගික ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සඳහා වන නව විධික්‍රම පාසල් පද්ධතියට හඳුන්වා දීම.
- විෂයමාලා සංවර්ධන හා ක්‍රියාත්මක කිරීමේ කාර්යයෙහි නියුක්ත පිරිස්වල වෘත්තීය නිපුණතා වැඩි දියුණු කිරීම.
- විෂයමාලා සංවර්ධන හා ක්‍රියාත්මක කිරීම යන ක්ෂේත්‍රවල තොරතුරු අනාවරණය කර ගැනීම සඳහාත් අධ්‍යාපනයේ ගුණාත්මක ප්‍රවර්ධනය සඳහාත් ඉවහල් වන පර්යේෂණ අධ්‍යයන ක්‍රියාත්මක කිරීම.
- ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ හා ඇගයීම් ක්‍රියාමාර්ගවල සාර්ථකත්වය සඳහා නව විධික්‍රම හඳුන්වා දීම.
- ශිෂ්‍යයන්ගේ සන්නිවේදන, තොරතුරු තාක්ෂණ නිපුණතා සහ ජාතික හා ජාත්‍යන්තර භාෂා නිපුණතා සංවර්ධනය කිරීම.
- සංස්කෘතික හා ස්වාභාවික උරුමය රැක ගැනීමේ සහ ආරක්ෂා කර ගැනීමේ නිපුණතා සිසුන් තුළ ඇති කිරීම.
- සමාජයේ ජීවත් වන විවිධ ජන කණ්ඩායම්වලට ආවේණික ආගමික, සංස්කෘතික හා භාෂාමය වශයෙන් පවත්නා විවිධත්වය අගය කිරීමටත් ශ්‍රී ලාංකිකයන් ලෙස සැම දෙනාට ම එක් ව සිටීමටත් අවශ්‍ය නිපුණතා සංවර්ධනය කිරීම.

**විෂයමාලා සංවර්ධනය වෙනුවෙන් 2012 වර්ෂයේ දී නිම කළ විෂයමාලා කාර්ය පහත දැක්වේ.**

- විෂයන් 46 කට අදාළව විෂයමාලා ව්‍යාප්ති සටහන් හා 6 සහ 10 ශ්‍රේණි සඳහා විෂය නිර්දේශ පිළියෙල කිරීම ආරම්භ කිරීම.
- අ.පො.ස. උසස් පෙළ භෞතික විද්‍යාව, රසායන විද්‍යාව හා දේශපාලන විද්‍යාව සඳහා ඉගෙනුම් සම්පත් පොත් සකසා අවසන් කිරීම හා තර්ක ශාස්ත්‍රය සඳහා ඉගෙනුම් සම්පත් පොත පිළියෙල කිරීම ඇරඹීම.
- අ.පො.ස. (උසස් පෙළ) රසායන විද්‍යාව, ජීව විද්‍යාව, ආර්ථික විද්‍යාව හා ගිණුම්කරණය විෂය හා සම්බන්ධ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ සංශෝධනය කිරීම.
- අ.පො.ස. (සාමාන්‍ය පෙළ) ගණිත අධ්‍යාපනය සවිමත් කිරීම සඳහා පුහුණු මොඩියුලයක් පිළියෙල කිරීම හා ගුරුවරුන් 40 දෙනෙකුට අවශ්‍ය පුහුණුව ලබා දීම.
- 6-9 ශ්‍රේණිවල පාසල් පාදක ඇගයීම සඳහා උපකරණ පිළියෙල කිරීම.
- මහජන විවේචන සැලකිල්ලට ගනිමින් විද්‍යාව, ගණිතය හා ඉංග්‍රීසි භාෂාව යන විෂයවල වඩා දුරවබෝධ සංකල්ප සුසාධනය අරමුණු කොට පරිගණක මෘදුකාංග අටක් පිළියෙල කිරීම හා 6-11 ශ්‍රේණිවල ඉංග්‍රීසි, ඉතිහාසය හා භූගෝල විද්‍යාව සඳහා මෘදුකාංග 20ක් පිළියෙල කිරීම ආරම්භ කිරීම.
- ආයතනය විසින් පිරිසැලසුම් කොට නිම කරන ලද විෂයමාලාවෙහි වැඩිදුර සංවර්ධනය උදෙසා මහජන අදහස් ලබා ගනු පිණිස "විවරණ ආකෘතියක්" නිර්මාණය කර අන්තර්ජාලයට මුදා හැරීම.

- නිමවන ලද විෂයමාලා සාර්ථක ලෙස ක්‍රියාවට නැංවීම අරමුණු කොට, විෂයමාලා ද්‍රව්‍ය හා ඇගයුම් උපකරණ අන්තර්ජාලයට උඩුගත කිරීම.
- තෝරාගත් පාසල් 11 ක ද්විභාෂීය අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පිරිවෙන්වල ද්විභාෂා අධ්‍යාපනය සඳහා සංකල්ප රාමුවක් සංවර්ධනය කර කෙටුම්පත් කිරීම.
- ද්විභාෂා අධ්‍යාපන තොරතුරු ප්‍රචලිත කිරීම සඳහා පුවත් සඟරා දෙකක් නිමවා අවසන් කිරීම.
- පවත්නා විෂයමාලාව ක්‍රියාත්මක කිරීමට උපකාරක වශයෙන් ගුරුවරුන් හා ගුරු උපදේශකවරුන් 1637 කට පුහුණුව ලබා දීම.

### 4.1 විෂය නිර්දේශ සකස් කිරම 2012

- මේ යටතේ පහත දක්වෙන විෂය නිර්දේශ 7 සකස් කරන ලදී.
  - ගණකාධිකරණය (අ.පො.ස. උ.පෙළ) (ඉංග්‍රීසි) - 12 සහ 13 ශ්‍රේණි
  - ව්‍යාපාර අධ්‍යයනය (අ.පො.ස. උ.පෙළ) (ඉංග්‍රීසි) - 12 සහ 13 ශ්‍රේණි
  - ආර්ථික විද්‍යාව (අ.පො.ස. උ.පෙළ) (ඉංග්‍රීසි) - 12 සහ 13 ශ්‍රේණි
  - ගණිතය (අ.පො.ස. උ.පෙළ) (ඉංග්‍රීසි) - 12 සහ 13 ශ්‍රේණි
  - සංයුක්ත ගණිතය (අ.පො.ස. උ.පෙළ) (ඉංග්‍රීසි) - 12 සහ 13 ශ්‍රේණි
  - ජාතික විද්‍යා පීඨ සඳහා ඉංග්‍රීසි විෂය නිර්දේශ සකස් කිරීම. (ප්‍රාථමික අධ්‍යාපන පාඨමාලාව, දෙවන විෂයය)
  - විදේශීය භාෂාවක් ලෙස ජපන් භාෂාව ඉගැන්වීමේ පාඨමාලාවේ විෂය නිර්දේශ සකස් කිරීම.

### 4.2 ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ සකස් කිරීම - 2012

- මේ යටතේ පහත දක්වෙන ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ 2 සකස් කරන ලදී.
  - චිත්‍ර කලාව (දෙමළ) - 13 ශ්‍රේණිය
  - අරාබි - 10 ශ්‍රේණිය

### 4.3 අතිරේක කියවීම් ද්‍රව්‍ය සකස් කිරීම - 2012

- මේ යටතේ පහත දක්වෙන අතිරේක කියවීම් ද්‍රව්‍ය සකස් කරන ලදී.
  - දෙමළ භාෂාව - 6 ශ්‍රේණිය
  - දෙමළ ගුරුවරුන්ගේ පරිහරණය සඳහා වාචික ඉංග්‍රීසි විෂය සඳහා ක්‍රියාකාරකම් සහිත අත් පොත - 1 හා 2 ශ්‍රේණිය
  - කෘෂි විද්‍යාව විෂයය සඳහා ප්‍රායෝගික ක්‍රියාකාරකම් අත්පොත (සිංහල) - 12 සහ 13 ශ්‍රේණිය
  - දෘඩ තාක්ෂණය සඳහා අතිරේක කියවීම් පොත (සිංහල / දෙමළ) - 12 ශ්‍රේණිය
  - සිවිල් තාක්ෂණවේදය සඳහා විමර්ශන ග්‍රන්ථය (සිංහල / දෙමළ) - 13 ශ්‍රේණිය

- විදුලිය ඉලෙක්ට්‍රොනික් හා තොරතුරු තාක්ෂණය - 13 ශ්‍රේණිය සඳහා විමර්ශන ග්‍රන්ථය (සිංහල)
- යාන්ත්‍රික තාක්ෂණවේදය සඳහා විමර්ශන ග්‍රන්ථය - 13 ශ්‍රේණිය
- ජීව සම්පත් තාක්ෂණවේදය සඳහා විමර්ශන - 13 ශ්‍රේණිය ග්‍රන්ථය (දෙමළ)
- කෘෂි විද්‍යාව සඳහා විමර්ශන ග්‍රන්ථය (දෙමළ) - 12 ශ්‍රේණිය
- ඉංග්‍රීසි විෂයය සඳහා විවිධ මාතෘකා යටතේ සහාය - 6 ශ්‍රේණිය කියවීම් පොත් 10ක් සකස් කිරීම.

*( ජෛව විවිධත්වය, සඳට සංචාරයක්, අමතක නොවන උපන් දින තෑග්ග, අරුන්, විනිශ්චය, අලුත් සපත්තු ජෝඩුවක්, චොක්ලට් සහ අර්තාපල්, නුවණැති වඳුරා, දිග කොණ්ඩය, මව සහ පුතුන්)*

- විවිධ පාඨමාලාවලට අදාළ ව සකස් කරන ලද අතිරේක විෂයමාලා ද්‍රව්‍ය

  - තොරතුරු තාක්ෂණ වෘත්තීය පාඨමාලාවට අදාළ යෝජනා සකස් කිරීම.
  - විද්‍යුත් මාර්ගික අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාවට අදාළ යෝජනා සකස් කිරීම.
  - විදේශීය භාෂාවක් ලෙස ජපන් භාෂාව ඉගැන්වීමේ ඩිප්ලෝමා පාඨමාලාවට අදාළ යෝජනා සකස් කිරීම.
  - ජපන්, කොරියන්, චීන සහ රුසියන් භාෂා පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා වලට අදාළ යෝජනා සකස් කිරීම.
  - ප්‍රාථමික ශ්‍රේණි ගුරු උපදේශක පුහුණු මොඩියුලය සඳහා සැලැස්ම සකස් කිරීම.
  - අධ්‍යාපනපති පාඨමාලාවට අදාළ පාඨමාලා අත්පොත සකස් කිරීම.

- වෙනත් ඉගෙනුම් ඉගැන්වීම් උපකරණ සකස් කිරීම

  - උපාධිධාරී නොවන නුපුහුණු ගුරුවරුන් සඳහා වන පාඨමාලාවේ පරිගණක විෂයය සඳහා පැවරුම් සකස් කිරීම.
  - ද්විභාෂා අධ්‍යාපනයට අදාළ ගුරු පුහුණු උපකරණ සකස් කිරීම.
  - 6-9 ශ්‍රේණි විෂයමාලාවේ දැක්වෙන දෙමළ ගීත වලට සංයුක්ත තැටි සකස් කිරීම.
  - 6-9 ශ්‍රේණි වල ඉගෙනුම ලබන දරුවන්ගේ සහ ගුරුවරුන්ගේ භාවිතය සඳහා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් සකස් කළ ආපදා ආරක්ෂණ අධ්‍යාපනය හා සම්බන්ධ මාධ්‍ය උපකරන කට්ටලය ඇතුළත් පොතක් සහ සංයුක්ත තැටියක් 6 ශ්‍රේණිය සඳහා නිර්මාණය කිරීම.
  - කථන හා ශ්‍රවන කුසලතා සඳහා පාසල් පාදක ඇගයීමට අදාළ ගුරු අත්පොතක් සකස් කිරීම.

## 5.0 අධ්‍යාපන නායකත්ව සංවර්ධනය හා වෘත්තිකභාවය වැඩිදියුණු කිරීම

අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ගේ වෘත්තීය සංවර්ධනය වැඩිදියුණු කිරීම ආයතනයට පැවරී ඇති ප්‍රධාන කාර්යවලින් එකකි.

මෙකී කර්තව්‍යය සාක්ෂාත් කෙරෙනුයේ අධ්‍යාපන දර්ශනපති පාඨමාලාවේ සිට විවිධ සහතික පත්‍ර පාඨමාලා දක්වා වූ පරාසයක විහිදී ඇති ශික්ෂණ කාර්ය පටිපාටියකිනි. සියලු අධ්‍යාපන කළමනාකරණ සංවර්ධන පාඨමාලා මීපේ පරිශ්‍රයෙහි පැවැත්වෙන අතර දිවයිනේ විවිධ ප්‍රදේශවල වාසය කරන අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියුතුවූවන්ට අධ්‍යාපනවේදී, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා හා අතිරේක භාෂා ප්‍රවීණතා පාඨමාලාවලට සහභාගිවීමේ අවස්ථාව සපයනු පිණිස ප්‍රාදේශිය මධ්‍යස්ථාන ස්ථාපිත කර ඇත. මේ පිළිබඳ වැඩිපුර තොරතුරු පහත වගු අංක 01 හි ඇතුළත් කර ඇත.

01 වන වගුව වෘත්තීය සංවර්ධන පාඨමාලා පිළිබඳ විස්තර 2012

| පාඨමාලාව | වගකීම දරන දෙපාර්තමේන්තුව | පාඨමාලාව පැවැත්වෙන ස්ථානය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| **පශ්චාත් උපාධි පාඨමාලාව** | | | |
| අධ්‍යාපන දර්ශනපති උපාධි පාඨමාලාව | ගුරු අධ්‍යාපන | ජා.අ.ආ. | 35 |
| අධ්‍යාපනපති පාඨමාලාව | ගුරු අධ්‍යාපන | ජා.අ.ආ./යාපනය | 189 |
| අධ්‍යාපන කළමනාකරණ විද්‍යාපති පශ්චාත් උපාධි පාඨමාලාව | අධ්‍යාපන පරිපාලන | මීපේ | 51 |
| **පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව** | | | |
| පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමා (පූර්ණකාලීන) පාඨමාලාව | අධ්‍යාපන පරිපාලන | මීපේ | 53 |
| පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමා (අර්ධකාලීන) පාඨමාලාව | අධ්‍යාපන පරිපාලන | මීපේ | 85 |
| පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව | ගුරු අධ්‍යාපන | ජා.අ.ආ /ප්‍රාදේශීය මධ්‍යස්ථාන 35 | 3300 |
| පශ්චාත් උපාධි පාසල් උපදේශන ඩිප්ලෝමා පාඨමාලාව | ගුරු අධ්‍යාපන | ජා.අ.ආ. | 31 |
| **උපාධි පාඨමාලා** | | | |
| අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව | ගුරු අධ්‍යාපන | ජා.අ.ආ / මධ්‍යස්ථාන 38 | 4500 |
| **ඩිප්ලෝමා පාඨමාලාව** | | | |
| පාසල් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | පාසල් කළමනාකරණ | මීපේ | 214 |
| දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ පාඨමාලාව ඩිප්ලෝමා පාඨමාලාව | ඉංග්‍රීසි | ජා.අ.ආ | 29 |
| පූර්ව ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන ඩිප්ලෝමාව | ප්‍රාථමික අධ්‍යාපනය | ජා.අ.ආ | 76 |
| විශේෂ අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | අන්තර්කරණ අධ්‍යාපනය | ජා.අ.ආ. | 53 |
| සංඥා භාෂා ඩිප්ලෝමා පාඨමාලාව | අන්තර්කරණ අධ්‍යාපනය | ජා.අ.ආ | 20 |
| **සහතික පත්‍ර පාඨමාලා** | | | |
| අතිරේක භාෂා සංවර්ධන පාඨමාලාව | ගුරු අධ්‍යාපන | ජා.අ.ආ./ මීපේ මධ්‍යස්ථාන 38 | 750 |
| **කෙටිකාලීන පාඨමාලා** | | | |
| අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ කෙටි කාලීන තේමා පාඨමාලා | අධ්‍යාපන පරිපාලන | මීපේ | 726 |
| පර්යේෂණ ක්‍රම පිළිබඳ තේමා පාඨමාලාව | පර්යේෂණ හා සංවර්ධන | ජා.අ.ආ | 50 |
| **විදේශිය සිසුන් සඳහා වන පාඨමාලාව** | | | |
| අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව | අධ්‍යාපන පරිපාලන | මීපේ | 23 |

### 5.1 ගුරු ආයතනික සංවර්ධන

පාසල් පද්ධතියේ විෂයමාලා සංශෝධන වලට අනුගත වන පරිදි ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ හා ගුරු විද්‍යාලවල පූර්ව සේවා හා සේවස්ථ පුහුණු පාඨමාලා පැවැත්වීමට අදාළව ආයතනික සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2012 වර්ෂයේ දී පහත දක්වා ඇති කාර්ය ඉටු කර ඇත.

- "තිරසාර සංවර්ධනය සඳහා අධ්‍යාපනය " සංකල්පය පදනම් කර ගනිමින් විශේෂඥ කණ්ඩායමක් විසින් සකස් කරන ලද පුහුණු අත්පොත භාවිත කිරීම සඳහා විද්‍යාපීඨ කථිකාචාර්යවරුන් 27 දෙනෙකු පුහුණු කිරීම.
- විද්‍යාපීඨ කථිකාචාර්යවරුන් හා ගුරු ශික්ෂකයන් අතර ක්‍රියාමූලික පර්යේෂණ කුසලතා වැඩිදියුණු කිරීම සඳහා සමාජ ඒකාග්‍රතාව පිළිබඳ ව සිදු කරන ලද ක්‍රියාමූලික පර්යේෂණ අධ්‍යයන අතරින් 34 ක් හොඳම නිදර්ශක ලෙස හඳුනා ගැනීම.
- අවශ්‍යතා අධ්‍යයනයකින් පසුව, ප්‍රාථමික පන්තිවල ඉංග්‍රීසි ඉගැන්වීමේ දී භාවිත කිරීම සඳහා ඉගෙනුම් - ඉගැන්වීම් සංග්‍රහයක් කෙටුම්පත් කිරීම.
- මිනුම් හා ඇගයීම් පිළිබඳ විද්‍යාපීඨ විෂය නිර්දේශය සංශෝධනය කිරීම.
- පූර්ව සේවා ගුරු අධ්‍යාපන පාඨමාලා යාවත්කාලීන කිරීම හා ඉහළ නැංවීම පිළිබඳ ගැඹුරු තලයේ අධ්‍යයනයක් සිදු කිරීම.
- දෙවැනි ජාතික භාෂාව පිළිබඳ ව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ කථිකාචාර්යවරුන් 32 දෙනෙකු පුහුණු කිරීම.

### 5.2 ජාතික අධ්‍යාපන ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ පාඨමාලා සඳහා විභාග පැවැත්වීම.

ආයතනය විසින් පවත්වනු ලබන විභාගවලට අදාළ වූ විභාග පටිපාටි සවිමත් කිරීමට හැකිවීම 2012 ජනවාරි - දෙසැම්බර් කාලය තුළ ආයතනය පත්කර ගත් විශේෂ ප්‍රගතියකි. ඒ යටතේ පහත සඳහන් විභාග 12ක් පවත්වා ඇත.

- පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව (II කොටස)
- දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (2011 - 2012 අවසාන විභාගය)
- පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව (ප්‍රවේශ විභාගය)
- පූර්ව ළමාවිය සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
- අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව (II කොටස)
- කළමනාකරණය පිළිබඳ අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව (IV කොටස)
- පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව (I කොටස)
- පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව (අවසාන කොටස)
- අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව (I කොටස)
- දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (2012 -2013 අවසාන කොටස)
- කළමනාකණය පිළිබඳ අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව (V කොටස)
- කාර්යක්ෂමතා කඩඉම් විභාගය

## 6.0 විකල්ප අධ්‍යාපනය

### 6.1 අන්තර්කරණ අධ්‍යාපනය

" සැමට අධ්‍යාපනය" යන සංකල්පය යථාර්ථයක් බවට පත් කර ගැනීමේ දී අන්තර්කරණ අධ්‍යාපන දෙපාර්තමේන්තුවට විශේෂ ස්ථානයක් හිමිවේ. විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා යෝග්‍ය පාසල් විෂයමාලාවක් සංවර්ධනය කිරීම, විශේෂ අධ්‍යාපන ගුරුවරුන්ට හා ගුරු උපදේශකවරුන්ට අවශ්‍ය පුහුණු කටයුතු සිදුකිරීම හා අතිරේක විෂයමාලා ද්‍රව්‍ය සම්පාදනය වැනි කාර්යවල වගකීම පැවරී ඇත්තේ මේ දෙපාර්තමේන්තුවට ය. මේ හැරුණු විට එමගින් අන්තර්කරණ අධ්‍යාපන, සංඥා භාෂා ආදි පාඨමාලා ඔස්සේ වෘත්තීය සංවර්ධන අවස්ථා සම්පාදනය කෙරේ. අදාළ කාලපරිච්ඡේදය තුළ උක්ත දෙපාර්තමේන්තුව විසින් ඉටුකරන ලද කාර්ය මෙසේය.

- බ්‍රේල් අධ්‍යාපන පුහුණු පැකේජය යාවත්කාලීන කිරීම හා සම්පත් පුද්ගලයන් 90 දෙනෙකු පුහුණු කිරීම.
- මධ්‍යම පළාතේ විශේෂ අධ්‍යාපනය හා සම්බන්ධ ගුරුවරුන් හා ගුරු උපදේශකවරුන් 75 දෙනෙකුට බ්‍රේල් අධ්‍යාපනය සම්බන්ධ පුහුණුවක් දීම.
- දෙපාර්තමේන්තුව විසින් සංවර්ධනය කරන ලද පුහුණු පැකේජයක් උපයෝගී කර ගනිමින් ඉගෙනුම් දුෂ්කරතා සහිත ළමයින්ට ඉගැන්වීම පිළිබඳ ව ගුරුවරුන් හා ගුරු උපදේශකවරුන් 100 දෙනෙකු පුහුණු කිරීම.
- විශේෂ අධ්‍යාපන හා සංඥා භාෂා ඩිප්ලෝමා පාඨමාලා සමායෝජනය කිරීම හා අවශ්‍ය දේශන පැවැත්වීම.
- විශේෂ අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාවේ ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය තොරතුරු පද්ධතියක් සකසා ගැනීම උදෙසා අධ්‍යයනයක් සිදුකිරීම.
- අන්තර්කරණ අධ්‍යාපන සඟරාව එළිදැක්වීම.

### 6.2 මුද්‍රණ හා ප්‍රකාශන

මුද්‍රණ හා ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් අදාළ කාලසීමාව තුළ මුද්‍රණය කරන ලද ප්‍රකාශන වර්ගය හා ප්‍රමාණය පහත දැක්වේ.

- විෂය නිර්දේශ 13
- ගුරු උපදෙස් සංග්‍රහ 08
- අතිරේක විෂයමාලා ද්‍රව්‍ය 12
- වාර සඟරා 07
- වෙනත් ප්‍රකාශන 44
- මොඩියුල 04
- අමතර කියවීම් පොත් 68
- ආරාධනා පත් 07
- විභාග අටක් සඳහා සහතික

## 6.3 විද්‍යුත් ප්‍රචාරණය

නොවිධිමත් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉතා ප්‍රබල මෙන් ම ආකර්ශණීය ඉගෙනුම්- ඉගැන්වීම් මෙවලම් ලෙස ප්‍රයෝජනයට ගැනෙන රූපවාහිනිය, ගුවන්විදුලිය හා සංයුක්ත තැටි බඳු ඉලෙක්ට්‍රොනික ඉගෙනුම් ද්‍රව්‍ය භාවිත කරමින් පාසල් ප්‍රජාව පමණක් නොව, ඊට පරිබාහිර විවිධ සමාජ කණ්ඩායම් ඉගෙනුම් සමාජයක් කරා ගෙන යැමේ කාර්යභාරය විද්‍යුත් ප්‍රචාරණ දෙපාර්තමේන්තුව ඉටු කරයි. විෂයමාලාවේ දුරවබෝධ සංකල්ප පැහැදිලි කරලීම සඳහාත්, විෂයමාලාවේ කරන වෙනස්කම් පිළිබඳ ව ප්‍රජාව දැනුවත් කිරීම සඳහාත්, ගීතය, සංගීතය, නාට්‍ය වැනි සෞන්දර්යාත්මක මාධ්‍ය යොදා ගනිමින් ජන මනස පුබුදුවාලීම සඳහාත් විවිධ වැඩ සටහන් නිෂ්පාදනය කිරීම ආයතනය ආරම්භයේ සිට ම කර ගෙන එනු ලබයි. 2012 වර්ෂයේ මෙම දෙපාර්තමේන්තුවෙන් ඉටු කරන ලද කටයුතුවල ප්‍රගතිය මෙසේ ය.

- නැණස වැඩසටහන් 72ක් නිම කොට ප්‍රචාරණය සඳහා බාර දීම.
- සතිපතා ගුවන්විදුලි වැඩසටහන් (නිපුණ) 38ක් සම්පූර්ණ කිරීම
- කාලීන ප්‍රස්තුත පදනම් කරගත් වැඩසටහන් 35ක් නිෂ්පාදනය කිරීම සහ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ස්වදේශීය සේවය මඟින් එය ප්‍රචාරයට පත් කිරීම.
- කැසට් පට 1280ක් පිටපත් කර අලෙවිය සඳහා නිකුත් කිරීම.

## 6.4 මාර්ගෝපදේශන හා උපදේශන සේවා

අධ්‍යාපන ප්‍රජාවගේ මානසික අවශ්‍යතා සපුරාලීමේ අරමුණ ඇති ව 2006 ජූනි මස උපදේශන හා මාර්ගෝපදේශන ඒකකය ජාතික අධ්‍යාපන ආයතනයෙහි ස්ථාපිත කරන ලදි. ශිෂ්‍ය ප්‍රජාව සඳහා වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන සේවා සැපයීම මේ ඒකකයට පැවරී ඇති වගකීමයි. වර්ෂය අවසාන වන විට මෙම ඒකකය විසින් සම්පූර්ණ කරන ලද කාර්ය මෙසේ ය.

- පාසල් සිසුන් හා දෙමාපියන් 118 දෙනෙකු සඳහා අභ්‍යන්තරික ව උපදේශන සැසි පැවැත්වීම.
- පාසල් මට්ටමේ ගැටලුවලට ආමන්ත්‍රණය කරනු පිණිස ජංගම පාසල් උපදේශන සැසි 16ක් පැවැත්වීම.
- පොදු දේශන 06ක් සංවිධානය කිරීම.
- ඒකකය විසින් සංවර්ධනය කරන ලද පුහුණු උපකරණ උපයෝගී කර ගනිමින් ප්‍රාථමික පාසල් ගුරුවරුන් 94 දෙනෙකු පුහුණු කිරීම.
- අධ්‍යාපන කලාප 13ක පාසල් උපදේශක වරුන් 320 දෙනෙකු පුහුණු කිරීම.

## 6.5 විවෘත ඉගෙනුම

විවිධ හේතු නිසා පාසල් අධ්‍යාපනය අහිමි වූ පුද්ගලයන්ට අධ්‍යාපනයේ මංපෙත් විවෘත කර දීම සඳහා දුරස්ථ පාඨමාලා පැවැත්වීම අරමුණු කරගෙන විවෘත පාසල් දෙපාර්තමේන්තුව පිහිටුවා තිබේ. විවෘත පාසල දුරස්ථ හා විවෘත ඉගෙනුම් ක්‍රම උපයෝගි කර ගනිමින් අධ්‍යාපනය ඉගෙනුම් ලාභියා වෙතට ගෙන යන ක්‍රියාවලියකි. අධ්‍යාපන සුදුසුකම්, රැකියාවක යෙදී සිටීම හෝ සමාජ ආර්ථික පසුබිම ආදී කිසිවක් නොසලකා සියලු දෙනාටම අධ්‍යාපනය ලබාදීමේ අවස්ථා පුළුල් කිරීමක් එමගින් අපේක්ෂා කෙරේ. ඉගෙනුම් ලභියාගේ අභිමතය පරිදි ඉගෙනුම ආරම්භ කර තමා කැමති මාධ්‍යයක් උපයෝගි කර

ගනිමින් උචිත පියවරක සිට ඉගෙනීම සඳහා විවෘත පාසල පහසුකම් සපයයි. 2012 වර්ෂය තුළ දී මෙම දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන කාර්ය ඉටුකරනු ලැබ ඇත.

- දිවයිනේ මධ්‍යස්ථාන 34 ක පැවත්වෙන විවෘත හා ද්විතීයික පාඨමාලා සඳහා ඉගෙනුම් ලාභීන් 2000ක් බඳවා ගැනීම.
- ගෘහ හා ප්‍රජා අධ්‍යාපනය හා ගණිතයට අදාළ මොඩියුල හයක් දෙමළ භාෂාවට පරිවර්තන කිරීම.
- යාපනය සහ කොළඹ යන විවෘත අධ්‍යාපන මධ්‍යස්ථානවල පාඨමාලා උපදේශකවරුන් 80ක් සඳහා ශක්‍යතා සංවර්ධන වැඩසටහනක් පැවැත්වීම.
- ඉගෙනුම් ලාභීන් සඳහා දිවයින පුරා ඇති මධ්‍යස්ථානවල දී උපකාරක සැසි 33ක් පැවැත්වීම.
- ඇගයීම් හා අධීක්ෂණ චාරිකා 07ක් සම්පූර්ණ කිරීම.

## 7.0 පර්යේෂණ, සැලසුම් හා සංවර්ධන

අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය උදෙසා විෂයමාලා සංවර්ධනය, වෘත්තීය සංවර්ධනය සහ අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ඉවහල් වන විවිධ පර්යේෂණ කිරීම ජාතික අධ්‍යාපන ආයතනය මගින් ඉටු කරන අතර, යථෝක්ත කාර්ය යථාර්ථයක් බවට පත්කිරීම සඳහා අවශ්‍ය කටයුතු පර්යේෂණ දෙපාර්තමේන්තුව, සැලසුම් හා ඇගයීම් දෙපාර්තමේන්තුව, බාහිර සම්පත් කළමනාකරණ ඒකකය එක් ව ක්‍රියාත්මක කරයි.

### 7.1 පර්යේෂණ හා සංවර්ධන කටයුතු

අධ්‍යාපන පර්යේෂණ ආරම්භ කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ පවත්වා ගෙන යාම අධ්‍යාපනයේ විවාදාත්මක අංශ සම්බන්ධ ව අදහස් හා මත සංවාදයට සාකච්ඡා මණ්ඩප සැලසුම් කිරීම, අධ්‍යාපනයේ නියැළි පිරිස් තුළ පර්යේෂණ කුසලතා ප්‍රවර්ධනය සඳහා අවස්ථා සම්පාදනය, පුද්ගලයන්ට සහ ආයතනවලට පර්යේෂණ ප්‍රදාන ලබාදීමෙන් පර්යේෂණ හැකියා සංවර්ධනයට අවස්ථා සැලසීම සහ පර්යේෂණ තොරතුරු ප්‍රචලිත කිරීම පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යයභාරය වෙයි. මෙම දෙපාර්තමේන්තුව විසින් 2012 ජනවාරි - දෙසැම්බර් කාලසීමාව තුළ නිම කරන ලද කාර්යය පහත සඳහන් වෙයි.

- ශ්‍රී ලංකාවේ විෂයමාලා ප්‍රතිපත්තියට අදාළ ලේඛන ඒකරාශි කිරීම.
- කුඩා පාසල්වල භාවිතයට ගැනීම සඳහා සම්පත් කට්ටලයක් සංවර්ධනය කිරීම හා සබරගමු පළාතේ නියාමනයට පාත්‍ර කිරීම.
- අධ්‍යාපන පර්යේෂණ වාර සඟරා 03ක් එළිදැක්වීම.
- ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ ඓතිහාසික සංවර්ධනය (1969-2009) ග්‍රන්ථයේ අවසන් කෙටුම්පත පිළියෙල කිරීම හා ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ උපදෙස් පරිදි එහි එක් එක් ලිපිය සමාලෝචනය සඳහා බාහිර විද්වත් සාමාජික පිරිසකට ඉදිරිපත් කිරීම.

- 1988 දී කන්නන්ගර අනුස්මරණ දේශන මාලාව ඇරඹීමේ පුරෝගාමියා වූ ආචාර්ය ජී.බී. ගුණවර්ධන ශූරීහු ආරාධනා ලැබ "කන්නන්ගර දැක්ම : අධ්‍යාපන ප්‍රතිසංස්කරණයේ අභියෝග මැයෙන්" 23 වැනි සී. ඩබ්. ඩබ්. කන්නන්ගර අනුස්මරණ දේශනය පැවැත්වීම.
- සාක් (SAARC) අධ්‍යාපන පර්යේෂණ සඟරාවේ 6 වැනි වෙළුම අවසන් කර මුද්‍රණය සඳහා භාරදීම.

## 7.2 සැලසුම් හා බාහිර සබඳතා

ආයතනය සතු භෞතික, මූල්‍ය හා මානව සම්පත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස උපයෝගී කර ගනිමින්, ආයතනයේ අරමුණු හා ඉලක්ක, ජාතික අරමුණු හා ඒකාබද්ධ කිරීමේ අභිලාෂය ඇති ව සැලසුම් හා ඇගයීම් දෙපාර්තමේන්තුව 2012 අවසන් වන විට පහත දැක්වෙන කාර්යය ඉටු කර ඇත.

- 2011 වාර්ෂික ප්‍රගති වාර්තාව හා 2012 කාර්යය සාධන වාර්තාව පිළියෙල කිරීම.
- ආයතනයේ මාසික හා ත්‍රෛමාසික ප්‍රගති වාර්තා පිළියෙල කිරීම හා අවශ්‍ය කටයුතු සඳහා ඒවා අදාළ අංශ වෙත ඉදිරිපත් කිරීම.
- 2012 ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම.
- ආයතනයේ සියලු දෙපාර්තමේන්තු හා අංශවල අවශ්‍යතාවලට අනුකූල ව අවශ්‍ය ලී බඩු හා කාර්යාලීය උපකරණ ලැයිස්තු සකස් කර සැපයීම් අංශයට බාරදීම.
- 2013 අයවැය ඇස්තමේන්තු සහ 2013 අයවැය ලේඛනය පිළියෙල කිරීම.
- 2013 - 2017 පස් අවුරුදු සැලැස්ම පිළියෙල කිරීම.
- 2013 ගුරු පුහුණු ලිත පිළියෙල කිරීම. (ජාතික අධ්‍යාපන ආයතනයේ මෙන්ම පළාත්වල භෞතික හා මූල්‍ය සම්පත් ඵලදායී ලෙස උපයෝජනය වන පරිදි ආයතනය විසින් සැලසුම් කරන ලද විෂයානුබද්ධ සියලු පුහුණු වැඩසටහන්වල විස්තර මෙහි ඇතුළත් වේ.)
- මහ බැංකුව, අධ්‍යාපන අමාත්‍යාංශය, ICTA හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව ආදී ආයතන විසින් ඉල්ලා සිටි පරිදි අදාළ තොරතුරු සැපයීම.

## 7.3 බාහිර සබඳතා

ආයතන නිලධාරීන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා ඉවහල් වන විවිධ පාඨමාලා සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලයට අවස්ථා සලසා දීම බාහිර සබදතා ඒකකයේ ප්‍රධාන වගකීම වේ. එයට අමතර ව පාසල් අධ්‍යාපන පද්ධතිය දැනුම් කේන්ද්‍රයක පදනම බවට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය (TSEP ) සඳහා ලෝක බැංකුව මගින් ද, දැනුමැති සමාජයක් උදෙසා අධ්‍යාපන වැඩසටහන (EKSP) සඳහා ආසියානු සංවර්ධන බැංකුව මගින් ද ජාතික එකාබද්ධතාව හා ආපදා කළමනාකරණය සඳහා GIZ ආයතනය මගින් හා ප්‍රාථමික අධ්‍යාපනය සදහා යුනිසෙෆ් ආයතනය (UNICEF) මගින් ද සපයන මූල්‍යාධාර සම්බන්ධීකරණ කටයුතු මෙම ඒකකය මගින් ඉටු කරයි. 2012 වර්ෂයේ ලෝක බැංකු ආධාර ලැබීම ප්‍රමාද වීම් නිසා කාර්යයමණ්ඩල සංවර්ධන වැඩ සටහන් ක්‍රියාවට නැගුණේ සීමා සහිත ව වුවද පහත සඳහන් කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය කටයුතු එම අංශය විසින් අදාළ කාලය තුළ ඉටු කොට ඇත.

- බාහිර සම්පත් කළමනාකරණ ඒකකය මගින් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ සහාය ඇති ව, ජනවාරි - දෙසැම්බර් කාලය තුළ ආයතනයේ නිලධාරීන් 25 දෙනෙකු සඳහා විදේශ වැඩමුළු හා සම්මන්ත්‍රණ සඳහා සහභාගීවීමට අවස්ථා සම්පාදනය කිරීම.
- GIZ හි මූල්‍ය අනුග්‍රහය ඇතිව දේශීය වශයෙන් පහත දැක්වෙන වෘත්තීය සංවර්ධන අවස්ථා සපයාදීම.
  - කාර්ය මණ්ඩල නිලධාරීන් 52 දෙනෙකු සඳහා ජර්මන් තාක්ෂණික සහයෝගිතාව ( GIZ ) අනුග්‍රහයෙන් MDF උපදේශකවරුවන්ගේ සහභාගිත්වයෙන් වෘත්තීය සංවර්ධන පාඨමාලාවක් පැවැත්වීම.
  - නිලධාරීන් 22 දෙනෙකු "ඉංග්‍රීසි මගින් රාජ්‍ය සේවක කුසලතා සංවර්ධන වැඩසටහනට" (SIEPS) සහභාගි කරවීම.
- ඕස්ට්‍රේලියාවේ පිලින්ඩර්ස් විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනපති උපාධියක් හැදෑරීම සඳහා ඕස්ට්‍රේලියානු රජය මගින් පිරිනමන (AusAID) ශිෂ්‍යත්වයක් දිනාගැනිමට ආයතනයේ නිලධාරිනියක් හට මඟ පෙන්වීම.

## 8.0 පරිපාලන මූල්‍ය හා සහායක සේවා

ආයතනයේ විෂයමාලා සංවර්ධන, අධ්‍යාපන, නායකත්ව සංවර්ධන හා ගුරු අධ්‍යාපන, සැමට අධ්‍යාපන, පර්යේෂණ සැලසුම් හා සංවර්ධන පීඨ විසින් කරනු ලබන සියලු ම කාර්යය සඳහා මූල්‍ය, භෞතික සම්පත් හා කළමනාකරණ සේවා සම්පාදනය සහ සහාය සේවා සැපයීම, සාමාන්‍ය පරිපාලන අංශයේ කාර්යභාරයයි. මෙම අංශය යටතේ ආයතනයේ එදිනෙදා පරිපාලන කාර්යය හා සම්බන්ධ සියලු ම කටයුතු හා කාර්ය මණ්ඩලය පුහුණු අවශ්‍යතා හඳුනාගෙන ඔවුන්ට අදාළ පුහුණු අවස්ථා ලබා දීමේ කටයුතු මානව සම්පත් සංවර්ධන හා පාලන දොපර්තමේන්තුව මගින් ද ආයතනයේ සියලුම කාර්යය සඳහා මූල්‍ය සම්පත් ලබා දීම, ආදායම් හා පිරිවැය වාර්තා මූල්‍ය නීතිරීති අනුව පවත්වාගෙන යෑමේ කටයුතු මුදල් දොපර්තමේන්තුව මගින් ද, ආයතනයේ ගොඩනැගිලි ඉදිකිරිම, නඩත්තු කටයුතු, විදුලි සහ දුරකථන සේවා පවත්වා ගෙන යෑම, යටිතල පහසුකම් සැපයීම, පවිත්‍රතා සහ ආරක්ෂක සේවා සම්බන්ධීකරණය හා ආයතනයේ භෞතික පරිසරය අධ්‍යාපනික කාර්යවලට සමීප වන අයුරින් පවත්වාගෙන යෑම ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව මගින් ද ඉටුකරනු ලැබේ.

### 8.1 පරිපාලන දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතන කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයන්ගෙන් වැඩි පිරිසක් විශ්‍රාම යෑමට ආසන්න වයසේ සිටින බැවින් ආයතනයේ නිමැවුම්වල ගුණාත්මක බව ආරක්ෂා කර ගැනීම සඳහා අත්දැකීම් සහිත පළපුරුදු කාර්ය මණ්ඩලයක් අන්තර්ග්‍රහණය කර ගැනීම හදිසි අවශ්‍යතාවක් සේ සලකා ඉටු කර ගත යුතු විය. එම නිසා, මේ තාක් ලබා ගත් අත්දැකීම් ද පාදක කර ගනිමින් පැවති ආයතනික ව්‍යුහය නව සංවිධාන ව්‍යුහයක් බවට පරිවර්තනය කොට ඒ සඳහා වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය මූලික පියවර සැලසුම් කරන ලදී. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ අධ්‍යක්ෂ තනතුරට පහළ සියලු තනතුරු නාම, ක්ෂේත්‍රයේ සිටින පළපුරුදු අත්දැකීම් ඇති පුද්ගලයින් ආකර්ශණය කර ගත හැකි වන පරිදි කථිකාචාර්ය හෝ අධ්‍යාපනඥ යනුවෙන් වෙනස් කිරීමටත් අධ්‍යයන

කාර්යමණ්ඩලයේ නොවන තනතුරු කළමනාකරණ චක්‍රලේඛවලට සමවන අයුරින් ස්ථාපිත කිරීමට ද ඒ සමඟ ම සැලසුම් කරන ලදී. සෑම තනතුරක් සඳහා ම බඳවා ගැනීමේ පටිපාටි තීරණය කරනු ලැබ ඇති අතර, " බඳවා ගැනීම් නියමාවලියක්" සකස් කොට අවශ්‍ය අනුමැතිය ද ලබා ගැනීමෙන් අනතුරු ව යථෝක්ත කළමනාකරණ වෙනස්කම් කිරීම ට කටයුතු සාකච්ඡා වෙමින් පවතී.

- යථෝක්ත කාර්යවලට අමතර ව 2012 ජනවාරි - දෙසැම්බර් කාලසීමාව ඇතුළත පරිපාලන දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන උසස්වීම් හා බඳවා ගැනීම් ලබා දී ඇත.

**බඳවා ගැනීම්**

| | | |
|---|---|---|
| සහකාර අධ්‍යක්ෂ ජනරාල් | - | 01 |
| අධ්‍යක්ෂ (ද්විතීයන පදනම මත ) | - | 01 |
| ව්‍යාපෘති නිලධාරී | - | 04 |
| සහකාර ව්‍යාපෘති නිලධාරී | - | 01 |

- ඊට අමතර ව ආයතනයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 08 දෙනෙකුගේ පාඨමාලා සම්බන්ධ ඉල්ලීම් සඳහා මූල්‍ය ප්‍රතිපාදන මෙන් ම අධ්‍යයන නිවාඩු ලබා දීම ද ඉටු කොට ඇත.

## 8.2 මූදල් දෙපාර්තමේන්තුව

- ස්ථාවර වත්කම් ලේඛනය හා ඇගයීම් පටිපාටි සකස් කොට අවසන් කිරීම.
- 2011 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය අවසන් කිරීම.

## 8.3 ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව

ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව මගින් 2012 දෙසැම්බර් වන විට ඉටුකර ඇති කාර්යය පහත දැක්වේ.

- මහරගම හා මීපේ පරිශ්‍රයන්හි පිහිටි සියලු නේවාසිකාගාර, විදේශීය උපදේශකවරුන් සහ අධ්‍යාපනඥයින් සඳහා වෙන ම අංශයක් සහිත ව වැඩිදියුණු කර අලුත්වැඩියා කිරීම.
- වසර කීපයක් තිස්සේ අත්හැර දමා තිබූ ආයතනයේ මළ අපවහන පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම.
- නව කාර්මික මාදිලියේ වතුර මෝටරයක් සවිකිරීම මගින් ආයතනයේ ජල සැපයුම් පද්ධතිය වැඩිදියුණු කිරීම.
- ප්‍රධාන ශ්‍රවණාගාරය සඳහා මධ්‍යම වායුසමීකරණ පද්ධතියක් සවිකිරීම.
- ආයතනයේ පවත්නා සම්මන්ත්‍රණ ශාලාව සඳහා නවීන ඇමතුම් පද්ධතියක් සහ වායුසමීකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම.
- පවත්නා ආරක්ෂණ පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා තෝරාගත් ප්‍රදේශ කීපයක් අවරණය වන

පරිදි කැමරා (CCTV) සවිකිරීම.

- ආයතනයේ වාහන සංචිතය යාවත්කාලීන කිරීම සඳහා අලුත් වාහන 03ක් එකතු කිරීම.
- පරිගණක 100 ක ජාලයක් සඳහා විද්‍යුත් හා ගොඩනැගිලි පහසුකම් සහිත ව මීපේ පරිගණක විද්‍යාගාරය ප්‍රතිසංස්කරණය කිරීම.
- මහරගම හා මීපේ පරිශ්‍රවල ගොඩනැගිලි අලුත්වැඩියා කර වැඩිදියුණු කිරීම.
- මීපේ පරිශ්‍රයෙහි ආරක්ෂක වැට වැඩිදියුණු කිරීම.

## 8.4 පුස්තකාල සේවා

ජාතික අධ්‍යාපන ආයතනයේ පුස්තකාලය අධ්‍යාපන විෂය ක්ෂේත්‍රය හා සම්බන්ධ විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන්, ගුරුවරුන් හා සිසුන් මෙන්ම අධ්‍යාපන විද්‍යාපීඨ හා ගුරු විදුහල් කථිකාචාර්යවරුන් සහ වෙනත් ආයතනවල අධ්‍යාපනඥයින්ගේ නිරන්තර පරිහරනයට බඳුන් වේ. එම පුස්තකාලයට 2012 වසරේ දී අලුතින් එකතු වු පොත් පත් හා සංයුක්ත තැටි පහත දැක්වේ.

| | |
|---|---|
| පොත් | 997 |
| පොත් (පරිත්‍යාග) | 2450 |
| විෂයමාලා ද්‍රව්‍ය | 07 |
| අධ්‍යාපනික වාර්තා | 71 |
| දේශීය වාර සඟරා | 05 |
| දේශීය වාර සඟරා (පරිත්‍යාග) | 07 |
| විදේශීය වාර සඟරා | 04 |
| පුවත් සඟරා (පරිත්‍යාග) | 15 |
| අධ්‍යාපන තොරතුරු ඇතුලත් සංයුක්ත තැටි | 21 |

ඊට අමතරව

- ස්වයංක්‍රීය පුස්තකාල තොරතුරු පද්ධතිය යාවත්කාලීන කිරීම හා පරිගණක ගත කරන ලද දත්ත පද්ධති 02ක් නිර්මාණය කිරීම.
- පුස්තකාල සේවා පද්ධතිය දිශාභිමුඛ කිරීමේ වැඩ සටහන් දෙකක් පැවැත්වීම.
- පාසල් පුස්තකාලධිපතිවරුන් වෙනුවෙන් පුහුණු වැඩමුළු දෙකක් පැවැත්වීම යන සංවර්ධන කාර්යය ද පුස්තකාලසේවා දෙපාර්තමේන්තුව විසින් අදාළ කාලය තුළ ඉටු කොට ඇත.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல / My No: එස්/අයි/එන්අයිඊ/එෆ්ඒ/2012

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2013 නොවැම්බර් 21 දින

21 NOV 2013
695

21 NOV 2013
36 544
අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය

අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික අධ්‍යාපන ආයතනය.

ජාතික අධ්‍යාපන ආයතනයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

(එච්.ඒ.එස්.සමරවීර)
විගණකාධිපති

පිටපත:- 1. ලේකම්, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
2. ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය

අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, புத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone: 2887028 - 34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No.: 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail.: oaggov@sltnet.lk

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**


මගේ අංකය / எனது இல / My No : ඊසී/අයි/එන්අයිඊ/එෆ්ඒ/2012
ඔබේ අංකය / உமது இல / Your No. :
දිනය / திகதி / Date : 2013 නොවැම්බර් ᐟ දින.

අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික අධ්‍යාපන ආයතනය.

**ජාතික අධ්‍යාපන ආයතනයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ජාතික අධ්‍යාපන ආයතනයේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනතේ 19 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාරව ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත 2013 අගෝස්තු 15 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.


අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone : 2887028 -34
ෆැක්ස් අංකය / பக்ஸ இல / Fax No. : 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. : oaggov@sltnet.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාර වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ජාතික අධ්‍යාපන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන 2013 පෙබරවාරි 28 දින ඉදිරිපත් කර තිබුණි. ගිණුම් විගණනයෙන් පසුව මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණන විමසුම් නිකුත් කරන ලදි. එම විමසුම්වලින් රු.32,880,333 ක ගිණුම්කරණ අඩුපාඩු පෙන්වා දුන් අතර එම ගිණුම්කරණ අඩුපාඩුවලින් රු.30,311,575 ක් නිවැරදි කර සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2013 ජුනි 12 දින ඉදිරිපත් කරන ලදි. තෝරා ගන්නා ලද නියැදියෙන් බාහිරව තවදුරටත් මෙවැනි අඩුපාඩු තිබීම විගණනයේදී බැහැර කළ නොහැක.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී වත්කම් අපහරණය කිරීම තුළින් ඇති වී තිබූ රු.43,478 ක ලාභය හඳුනාගෙන මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳ වාර්තාවට ගලපා නොතිබුණි.

(ඇ) 2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම වත්කම් යටතේ ඇතුළත්ව තිබූ යල් පැන ගිය තොග ගිණුමේ රු.2,525,275 ක ශේෂය කිසිදු අනුමැතියකින් තොරව වත්කම් ඉවත් කිරීමේ ලාභ සංචිත ගිණුමට ගැලපීම හේතුවෙන් එම ගිණුම් ශේෂය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර තිබුණි.

### 2.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2008 වර්ෂයේදී පාසල්වල ඇගයීම් ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කිරීම වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු.3,237,800 ක මුදල සමාලෝචිත වර්ෂය තුළදී අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) සේවය අතහැර ගිය නිලධාරීන් 04 දෙනෙකු වෙත ලබා දී තිබූ එකතුව රු.294,722 ක් වූ ණය ශේෂ වසර 12 කට අධික කාලයක සිට අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) අධ්‍යයන කටයුතු සඳහා විදේශ නිවාඩු ලබාගෙන තිබුණු නිලධාරියෙකු නැවත සේවය සඳහා වාර්තා නොකිරීම හේතුවෙන් අනියම් දීමනා හා උණුසුම් ඇඳුම් දීමනා ලෙස ගෙවා තිබූ රු.60,431 ක මුදල වර්ෂ 02 කට අධික කාලයක සිට අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

## 2.2.3 **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 104 | හදිසි අනතුරක් සිදු වූ වහාම අදාළ පරීක්ෂණ සිදුකර අලාභයේ ප්‍රමාණය හා වගකිව යුතු නිලධාරීන් තීරණය කළ යුතු වුවද, වාහන 03 කට සිදු වූ අනතුරු 03 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | රු.14,000,000 ක්වූ පරිගණක සම්බන්ධයෙන් චක්‍රලේඛය ප්‍රකාර ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඇ) 2011 දෙසැම්බර් 30 දිනැති අංක 155 දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛය | රජයේ සේවකයෙකු සඳහා ගෙවිය හැකි උපරිම ආපදා ණය ප්‍රමාණය රු.250,000 කට සීමා කළ යුතු වුවත්, එයට පටහැනිව නිලධාරීන් 53 දෙනෙකු වෙනුවෙන් එකී සීමාව ඉක්මවා එකතුව රු.3,803,191 ක ආපදා ණය මුදල් ලබා දී තිබුණි. |

3. **මූල්‍ය සමාලෝචනය**

---------------------

3.1 **මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ ආයතනයේ මෙහෙයුම් කටයුතුවලින් ලැබූ මූල්‍ය ප්‍රතිඵලය රු.34,626,857 ක ඌණතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.41,078,116 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රු.75,704,973ක පිරිහීම සඳහා මෙහෙයුම් ආදායම් රු.79,905,282 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3.2 **ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

--------------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයතනය විසින් අනිවාර්ය සේවා ගිවිසුම් කඩ කිරීම හා ඇප බැඳුම්කර ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් නිලධාරීන් හතර දෙනෙකුට එරෙහිව එකතුව රු.10,681,604 ක වන්දි ඉල්ලා අධිකරණවල නඩු 04 ක් ගොනුකර තිබුණි.

(ආ) නිලධාරීන් දෙදෙනෙකු හා අභ්‍යාසලාභියෙකු විසින් නැවත සේවයේ පිහිටුවා ගැනීමට හා පාඨමාලා සහතිකය ලබාගැනීම සඳහා ආයතනයට එරෙහිව අධිකරණවල නඩු 03 ක් ගොනු කර තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---

### 4.1 කාර්ය සාධනය

---

2012 වර්ෂයේ පැවැත්වීමට සැළසුම් කර තිබූ විභාග 23 න් විභාග 10 ක් පවත්වා නොතිබුණි. 2012 වර්ෂයට පෙර පැවැත්වූ විභාග 13 කින් විභාග 5 ක ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා මාස 12 ත් මාස 28 ත් අතර කාලයක් ප්‍රමාද වී තිබූ අතර 2012 මුල් අර්ධ වර්ෂය තුළදී පවත්වන ලද විභාග 04 ක ප්‍රතිඵල නිකුත් කිරීමට විගණිත දිනය වූ 2013 අප්‍රේල් 11 දින වන විටද නොහැකි වී තිබුණි.

### 4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එකම වැඩමුළුවක් සඳහා රු.20,000 ක උපරිමයකට යටත්ව කොටස් වශයෙන් අත්තිකාරම් ලබාදීම හේතුවෙන් අවස්ථා 31 කදී එකතුව රු.586,600 ක් වූ අත්තිකාරම් මුදල් වියදම් නොකර ආපසු තැන්පත් කර තිබුණි.

(ආ) 2007 වර්ෂයේ දී අධ්‍යයන කටයුතු සඳහා විදේශගත වූ නිලධාරිණිය යළි සේවයට වාර්තා නොකර සිය අනිවාර්යය සේවා ගිවිසුම කඩ කිරීම හේතුවෙන් රු.353,840 ක් දණ්ඩන මුදල ලෙසද, වර්ෂ 2 ක් වැටුප් සහිත නිවාඩු ලබාදීම හේතුවෙන් ගෙවූ රු.704,734 ක වැටුප්ද, එම කාලපරිච්ඡේදයේදී නිලධාරිණිය වෙනුවෙන් ආයතනය විසින් දරන ලද රු.122,069 ක වියදම් හා නිවාඩු කාලය නිමා වී නැවත සේවයට වාර්තා නොකරන ලද කාලය තුළදී රු.154,642 ක වැටුප්ද ආයතනය වෙත අයවිය යුතුව තිබුණි. එම මුළු මුදල වන රු.1,335,285 ක් අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගත් බව ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා දැනුම් දී තිබුණි.

### 4.3 නිෂ්ක්‍රිය ඌණ උපයෝජිත වත්කම්

---

2010 වර්ෂයේ දී උපාධි නොවන ගුරු මධ්‍යස්ථාන සඳහා ත්‍රෛභාෂාවෙන් මුද්‍රණය කළ රු.2,111,775 ක් වූ පොත් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් ඉතිරිව තිබුණි.

4.4 **කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

---

තෙමහල් නේවාසිකාගාරයේ වැසිකිළි පද්ධතියක් ඉදිකිරීම සඳහා සැලසුම් සකස් කිරීම, ප්‍රමාණ පත්‍රය හා ටෙන්ඩර් ලියවිලි සකස් කිරීම ආදිය සඳහා 2008 වර්ෂය තුළදී උපදේශක සේවා ගාස්තු ලෙස පෞද්ගලික ආයතනයක් වෙත රු.1,200,949 ක් ගෙවා තිබුණි. වසර 20කට වඩා පැරණි ගොඩනැගිල්ලකට විශාල මුදලක් වැයකර වැසිකිළි, නානකාමර ඉදිකිරීම කාලීනව ආර්ථික ලෙස ඵලදායි නොවන බවට අධ්‍යක්ෂ ජනරාල් විසින් 2012 ජූනි 11 වන දින තීරණය කර තිබීම හේතුවෙන් කෙරිගෙන යන වැඩ යටතේ දක්වා තිබුණු රු.1,200,949 ක මුදල නිෂ්ක්‍රීය වියදමක් බව නිරීක්ෂණය විය.

4.5 **ප්‍රමාද වූ ව්‍යාපෘති**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) භාවිතයෙන් ඉවත් කරන ලද ජල ටැංකිය 2011 අගෝස්තු 17 දිනට පෙර කඩා ඉවත් කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව පෞද්ගලික ආයතනයකට රු.115,000 කට පිරිනමා තිබුණද, 2013 අප්‍රේල් 10 දින වන විටත් එම කාර්යය අවසන් කර නොතිබුණි.

(ආ) ජාතික අධ්‍යාපන ආයතනයේ පිහිටි ඉඩමේ වෙල්යායට මායිම් වූ කොටසේ කටු කම්බි ගැසීම සඳහා වූ කොන්ත්‍රාත්තුවේදී ඉටු කළ යුතු කාර්යයන් සඳහා රු.78,650 ක් වූ අවම මිල පිළිනොගැනීමට හේතු නොදක්වා දෙවන අවම මිල වන රු.91,850 කට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණද එම මිලට කොන්ත්‍රාත්තුව නිම කළ නොහැකි බව කොන්ත්‍රාත්කරු විසින් දැන්වීම හේතුවෙන් නැවත මිල ගණන් කැඳවීමට ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි. එම නිසා අදාල කාර්යය විගණිත දිනය වූ 2013 අප්‍රේල් 05 දින වන විටත් ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

---------------------------------------

### 5.1 ක්‍රියාකාර සැලැස්ම

---------------------

2012 වර්ෂය සඳහා වන ක්‍රියාකාර සැලැස්මට අනුව පැවැත්විය යුතු වැඩමුළු සංඛ්‍යාව 1194 ක් වූ අතර ඉන් වැඩමුළු 224 ක් පැවැත්වීමට අපොහොසත් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| | සැලැස්ම අනුව පැවැත්විය යුතු වැඩමුළු සංඛ්‍යාව | පැවැත් වූ වැඩමුළු සංඛ්‍යාව | නොපැවැත්වූ වැඩමුළු සංඛ්‍යාව |
|---|---|---|---|
| භාෂා මානව සහ සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව | 497 | 408 | 89 |
| විද්‍යා හා තාක්ෂණ පීඨය | 257 | 197 | 60 |
| සැලසුම් පර්යේෂණ හා ගුරු අධ්‍යාපන පීඨය | 110 | 75 | 35 |
| විකල්ප අධ්‍යාපන හා ගුරු අධ්‍යාපන පීඨය | 330 | 290 | 40 |
| | 1194 | 970 | 224 |

### 5.2 අයවැය පාලනය

-----------------

සමාලෝචිත වර්ෂයේ අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් අතර සියයට 11 සිට සියයට 1509 දක්වා විචලනයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කළමනාකරණ කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

6. **පද්ධති හා පාලන**

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වරින් වර දන්වන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) වත්කම් හා ගබඩා පාලනය

(ආ) පොත් හා ග්‍රන්ථ මුද්‍රණය

(ඇ) අයවැය පාලනය

(ඈ) අධ්‍යයන කටයුතු සඳහා විදේශ ගමන්

(ඉ) විභාග පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම

(ඊ) ප්‍රසම්පාදනය

එච්.ඒ.එස්.සමරවීර
විගණකාධිපති

***ජාතික අධ්‍යාපන ආයතනයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාවට අදාළ පැහැදිලි කිරීම් වාර්තාව***

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

(අ) පිළිගනිමි.

විගණකාධිපති වාර්තාවේ සඳහන් පරිදි විගණන විමසුම් මගින්

| | |
|---|---|
| පෙන්වා දී ඇති ගිණුම්කරණ අඩුපාඩු වටිනාකම | රු. 32,880,333.00 |
| ඒ අනුව නිවැරැදි කළ ගිණුම්කරණ අඩුපාඩු වටිනාකම | රු. 30,311,575.00 |
| නිවැරැදි නොකරන ලද ගිණුම්කරණ අඩුපාඩු වටිනාකම | රු. 2,568,758.00 |

මේ අනුව ගැලපුම් නොකල අඩුපාඩු පිළිබද විස්තරය

| | |
|---|---|
| වත්කම් අපහරණය කිරීමේ ලාභය | රු. 43,478.00 |
| යල්පැනගිය තොග ගිණුමේ ශේෂය | රු. 2,525,275.00 |
| | රු. 2,568,753.00 |

මෙම මුදලින් රු. 43,478/= මුදල (ආ) පරිදි 2013 වසරේ ගිණුම මගින් ගැලපුම් කරනු ලැබේ.

ඉතිරි මුදල වන රු.2,525,275/= මුදලින් සත්‍ය ලෙසට යල් පැනගිය තොග ලෙස කපාහැර ඇත්තේ රු.631,444 /= කි. තවද මේ සඳහා ආයතන සභාවේ අනුමැතිය (369.6.5) ලබාගෙන ඇති අතර අධ්‍යාපන ලේකම් මගින් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට ඉල්ලීම් කර ඇත. එබැවින් අපගේ තොරතුරු වලට අනුව 2012 වසරේ ගිණුම තුළ නිවැරැදි නොකරන ලද ගිණුම්කරණ අඩුපාඩු වශයෙන් සැලකිය හැක්කේ රු. 674,922 /= කි. (රු. 43,478 + රු. 631,444 )

(ආ) පිළිගනිමි. මේ අනුව 2013 වසරේ ගිණුම් මගින් මෙය ගැලපීම් කිරීමට උපදෙස් ලබා දී ඇත.

**වර්තමාන තත්ත්වය**

2013 ගිණුම් වර්ෂයේ දී අදාළ නිවැරැදි කිරීම් කර අවසන් ගිණුම් ඉදිරිපත් කරනු ලැබේ.

(ඇ) 2002 වර්ෂයේ පමණ සිට ඉදිරියට පැවත ගෙන එන තොග ශේෂයකි. 2013.01.22 දින පැවති 369 වැනි ආයතනයේ සභාවේ (369.6.5) අනුමැතිය ලබාගෙන මෙම ගැලපීම් සිදු කර ඇත. කෙසේ වෙතත් මේ සම්බන්ධව දැනට පහත පියවර ගෙන ඇත.

ගබඩාවේ තබා ගත යුතු ප්‍රශස්ථ තොග මට්ටම් පිළිබඳ වාර්තාවක් මාස 3 ක් ඇතුළත පිළියෙල කරන ලෙස ගබඩා භාරකරු වෙත දැනුම් දී ඇති අතර එහි නිවැරදිතාවය පරීක්ෂා කර බැලීමෙන් අනතුරුව එම තොග මට්ටම් නිසි ලෙස පවත්වාගෙන යාමටත්, ඉන් පරිබාහිරව අනවශ්‍ය තොග රැස් නොකිරීමටත් වගබලා ගන්නා ලෙස ගබඩා භාරකරු වෙත උපදෙස් ලබා දෙනු ලැබේ.

මෙයට අමතරව ගබඩා තොග වාර්තා පිළිබඳව විමසීමෙන් අනතුරුව ප්‍රසම්පාදන කටයුතුවල යෙදීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ප්‍රසම්පාදන නිලධාරී දැනුවත් කර ඇත.

**වර්තමාන තත්ත්වය**

ගබඩා තොග මට්ටම් පිළිබඳව කළමනාකරණ ක්‍රමයක් හඳුන්වා දීමට කටයුතු කරනු ලැබේ. (උපරිම තොගය, අවම තොගය, යලි ඇණවුම් මට්ටම) තීරණය කළ හැකි පරිදි . තවද රු.2,525,275/= ක යල්පැන ගිය තොග ගිණුමේ ශේෂයට අදාල භාණ්ඩ ආයතන සභාවේ අනුමැතියට යටත්ව වෙන්දේසි කිරීමට කටයුතු කර ඇති අතර මෙම භාණ්ඩවලින් බොහොමයක් විකුණා ඇත.

## 2.2.2 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

(අ) පසුගිය වසරේ පැවති COPE කමිටුවේදී ලබා දුන් උපදෙස් පරිදි මෙම මුදල බොල් ණය ලෙස කපා හැරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන ලදි. **( ඇමුණුම් 01 හා 02 )** තවද විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී සාකච්ජා වූ කරුණු අනුව මෙම මුදල කපා හැරීම සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු ඉටුකර දෙන ලෙස අධ්‍යාපන ලේකම් වෙත ලිපියක් යොමු කර ඇත. **(ඇමුණුම 03)** මීට අමතරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් ද රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත මේ පිළිබඳව දැනුවත් කිරීමේ ලිපියක් යොමු කර ඇත. **(ඇමුණුම 04 )**

**වර්තමාන තත්ත්වය**

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ පිළිතුරු ලද විගස අදාළ ගැලපීම් සිදු කරනු ලැබේ.

(ආ) මීට අදාළව යොමුකර තිබූ විගණන විමසුමේ සඳහන් කර තිබුණේ නිලධාරීන් තිදෙනෙකු සම්බන්ධව පමණි. ඒ අනුව අදාළ පැහැදිළි කිරීම් පහත දක්වා ඇත.

**එල්.පී.ජයසිංහ - රු. 93,674/=**

මෙම නිලධාරියා විභාග වංචාවක් සිදුකිරීම නිසා ඔහුට එරෙහිව පැවති විනය පරීක්ෂණයකින් පසු සේවයෙන් පහකර ඇත. එම විභාග වංචාව සම්බන්ධයෙන් මොහුට එරෙහිව මහාධිකරණයේ පැවති නඩුවෙන් මොහු වරදකරු වූ බැවින් දඩුවම් වශයෙන් සිර දඩුවම් නියම විය. මොහුගේ වයස හා ශාරීරික තත්ත්වය සලකා බලා ඔහුගේ වසර 05 ක සිර දඩුවම් වසර 03 කට අත්හිටුවා ඇත. ඊට අමතරව රු.50,000/= දඩ මුදලක් ද නියම කර ඇත. ඔහුගෙන් අයවීමට ඇති රු. 93,674/= ක මුදල පහත සඳහන් පරිදි අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

1. ඔහුට ගෙවීමට ඇති පාරිතෝෂික මුදල වන රු. 56,880/= මෙම මුදල සඳහා හිලව් කිරීම.

2. ඉතිරි මුදල වන රු. 36,794/= ක මුදල ඔහුගේ ඇපකරු වන විශ්‍රාම වැටුප් සහිත ඒ.වීරසිංහ මයාගෙන් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.

**වර්තමාන තත්ත්වය**

එල්.පි.ජයසිංහ මයාගේ පාරිතෝෂික මුදල රු. 56,880/= හිලව් කර ඇත. ඉතිරි රු. 36,794/= මුදල ඇපකරු වන ඒ.වීරසිංහ මයාගෙන් අයකර ගැනීම සඳහා 2013.12.24 දින අවසන් නිවේදනය නිකුත් කර ඇත. ඒ සඳහා ප්‍රතිචාර නොදැක්වුවහොත් විශ්‍රාම වැටුපෙන් අයකර ගැනීමට හෝ වෙනත් සුදුසු නෛතික ක්‍රියාමාර්ග ගන්නා බව දැනුම් දී ඇත.

**ජේ.ඒ.කේ.ජයලාලනී - රු. 16,667/=**

ආපදා ණය ශේෂය රු. 16,306/= මුදලක් හා පොලිය වශයෙන් රු. 485.10 මුදලක් 1998.11.11 දින ලදුපත් අංක 11997 මගින් ගෙවා ඇත. **(ඇමුණුම 05)**

**වර්තමාන තත්ත්වය**

මෙම මුදල අයකරගෙන තිබේ. 2012 අවසන් ගිණුම් මගින් මෙය ගලපා ඇත. **(J/E 42)**

**ඩී.එන්.තයමනී - රු. 46,056/=**

මෙම නිලධාරිනිය සේවය අතහැර ගොස් ඇත. ආපසු අයකර ගැනීම සඳහා පදිංචි ලිපිනයේ ඇය සොයා ගත නොහැක. ඇපකරු වන විශ්‍රාම වැටුප් ලාභී එස්.එම්.කාසිම් මියගෙන් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දි ඇත.

**වර්තමාන තත්ත්වය**

ඇපකරු වන එස්. එම්. කාසිම් මියට මේ බව දැනුම් දී ඇත.

(ඇ) <u>**ණය අත්තිකාරම්**</u>

**සාමාන්‍ය අත්තිකාරම්**

**බී.කේ.විජේගුණවර්ධන - රු. 60,431/=**

මෙම මුදලේ රු. 42,988.50 ක් ලබාදී ඇත්තේ 2007 සැප්තැම්බර් සිට 2011 ජූලි දක්වා වීනයේ පැවැත්වෙන ආචාර්ය උපාධි පාඨමාලාව සඳහා සහභාගිවීම වෙනුවෙන් ලබා දුන් අනියම් වියදම් දීමනාව වශයෙනි. රු. 17,212.50 ක මුදල ලබා දී ඇත්තේ මෙම ගමනේ උණුසුම් ඇඳුම් දීමනාව වෙනුවෙනි. මෙම මුදල අයකර ගැනීමට අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.

තවද රු. 230/= ක් වූ මුදල ගණනය කිරීමේ දෝෂයක් හේතුකොට ගෙන සටහන් වී ඇති බවත්, මෙය 2013 වර්ෂයේ ගිණුම්වලින් ගැලපීම් කිරීමට කටයුතු කරනු ලැබේ.

**වර්තමාන තත්ත්වය**

මෙම මුදල අයකර ගැනීම සඳහා 2013.11.15 දින නීතිපති දෙපාර්තමේන්තුව මගින් එන්තරවාසි නිකුත් කර ඇත.

**2.2.3** <u>**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**</u>

<u>**නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව**</u>

| | | |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 104 - | මේ වනවිට රිය අනතුරු 3 සම්බන්ධව පරීක්ෂණ සිදුකර ඇත. මු.රෙ. 104 පරීක්ෂණ පැවැත්වීම සඳහා අවශ්‍ය වන මූලික ලේඛන ආයතනයට ලැබීමේ යම් යම් ප්‍රමාදයන් හේතුවෙන් පරීක්ෂණ මණ්ඩල පත් කිරීම් ප්‍රමාද වී ඇතත් ඉදිරියේදී මෙවැනි ප්‍රමාදයන් අවම වන ආකාරයට කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත. |

**වර්තමාන තත්ත්වය**

මේ වන විට මෙම පරීක්ෂණ අවසන් කර ඇත. මින් ඉදිරියට මෙවැනි අඩුපාඩු ඇති නොවන ලෙස පරීක්ෂණ කඩිනම් කිරීමට උපදෙස් ලබා දී ඇත.

(ආ) භාණ්ඩාගාර චක්‍රලේඛ - පිළිගත නොහැක. මේ සඳහා වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර ඇත.

**වර්තමාන තත්ත්වය**

ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කරමින් පවතී.

(ඇ) භාණ්ඩාගාර චක්‍රලේඛ - දැනට රු. 250,000/= සීමාවට යටත්ව ආපදා ණය මුදල් ගෙවීම් කිරීමට කටයුතු කරනු ලැබේ.

**වර්තමාන තත්ත්වය**

විගණන විමසුම මගින් පෙන්වා දුන් කරුණු අනුව රු. 250,000/= සීමාව ඉක්මවා ආපදා ණය මුදල් ලබා දෙනු නොලැබේ.

3. <u>**මූල්‍ය සමාලෝචනය**</u>

3.1 **මූල්‍ය ප්‍රතිඵල**

මෙම තත්ත්වයට හේතු වූ කරුණු පහත දක්වා ඇත.

2011 වර්ෂයට සාපේක්ෂව මෙහෙයුම් ආදායම් පහත පරිදි අඩුවීම සිදු වී ඇත.

| | |
|---|---|
| ඒකාබද්ධ අරමුදල් (පුනරාවර්තන වියදම් සඳහා ලැබීම්) | රු. 2,462,000.00 |
| විදේශ ආධාර (යුනිසෙෆ්) | රු. 2,491,915.19 |
| විදේශ ආධාර (GIZ) ආධාර | රු. 2,026,922.86 |
| ESDG ආධාර | <u>රු. 25,000,000.00</u> |
| | රු. 31,980,838.05 |
| | ============ |

**ආදායම් අඩුවීම**

| | |
|---|---|
| පාඨමාලා ගාස්තු හා විභාග ගාස්තු අඩුවීම් | රු. 28,431,809.40 |
| විවිධ ආදායම් | රු. 40,783,244.62 |
| තැන්පතු (දේශීය) | රු. 2,118,620.34 |

**වියදම් වැඩිවීම**

| | |
|---|---|
| ක්ෂය වියදම් වැඩිවීම | රු. 6,620,065.06 |
| මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය වියදම් වැඩිවීම | රු. 5,122,287.27 |
| නේවාසිකාගාර වියදම් වැඩිවීම | රු. 7,983,496.35 |
| වැඩමුළු සම්පත් පුද්ගල වියදම් වැඩිවීම | රු.13,459,954.25 |
| වැඩමුළු සංග්‍රහ වියදම් වැඩිවීම | රු. 2,412,224.66 |
| විභාග වියදම් වැඩිවීම | රු. 3,467,711.50 |

3.2 **ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

(අ) **780/M - දිසා අධිකරණය, නුගේගොඩ - කේ.ඒ.ඇන්ටන් කුමාරයියා**

මෙම නඩුවේ අභ්‍යාසලාභියා වන ප්‍රධාන පැමිණිලිකරු පදිංචි ලිපිනය සොයා ගත නොහැකි වූ බැවින් ඔහුගේ ඇපකරු වන නඩුවේ 2වන විත්තිකාරිය වන එස්.එම්.කාසිම් මියගෙන් එකී මුදල වන රු. 2,237,337.05ක් වූ මුදල ලබා ගැනීම සඳහා ඒක පාර්ශවික නඩු තීන්දුවක් ලබා දීමට අධිකරණයෙන් අවසර ඉල්ලා සිටි අතර, එම නඩු තීන්දුව අධිකරණයේ පිස්කල්වරයා මගින් 2 වන විත්තිකරුට භාර දීමට නියෝග කෙරින.

**වර්තමාන තත්ත්වය**

මෙම නඩුවේ අභ්‍යාසලාභියා වන ප්‍රධාන පැමිණිලිකරු පදිංචි ලිපිනය සොයා ගත නොහැකි වූ බැවින් ඔහුගේ ඇපකරු වන නඩුවේ 2වන විත්තිකාරිය වන එස්.එම්.කාසිම් මියගෙන් එකී මුදල වන රු. 2,237,337.05 ක් වූ මුදල ලබා ගැනීම සඳහා ඒක පාර්ශවික නඩු තීන්දුවක් ලබා දී ඇත.

**4801/05/M - දිසා අධිකරණය, ගල්කිස්ස - එස්.එම්.ජේ.සෙනෙවිරත්න**

මෙම නඩුවේ පැමිණිලිකරු හා ඇපකරුවන් දෙදෙනා සියරට අතහැර දමා ගොස් ඇති බැවින් ඔවුන් සොයා ගැනීමට අදාළ ප්‍රදේශයේ පොලිසිය හා ප්‍රාදේශීය ලේකම් වෙත දැනුම් දී ඇති අතර, එකී ලිපිනයන්වල ඔවුන් පදිංචිය සොයා ගත නොහැකි බවට වාර්තා කර ඇත. මෙම නඩුව තාවකාලිකව බහා තබා ඇත.

**වර්තමාන තත්ත්වය**

ඔවුන් දැනට විදේශයේ පදිංචිව ඇතැයි කියනු ලබන ලිපිනය සොයා ගැනීමට ඇමරිකාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයට දැනුම් දී ඇතත් එය සොයා ගැනීමට නොහැකි වී ඇත. මෙම නඩුව තාවකාලිකව බහා තබා ඇත.

**7018/M - දිසා අධිකරණය, ගල්කිස්ස - ඒ.පී.එස්.එස්.පතිරණ**

මෙම නඩුව විභාගයට ගෙන ඇත. මෙම නඩුව සඳහා විත්ති පක්ෂයෙන් විරෝධතා ගොනු කර ඇති අතර, නියෝගය හා ඉදිරි විභාගයට 2013.11.11 දිනට කැඳවා තිබුණි.

**වර්තමාන තත්ත්වය**

මෙම නඩුව දැනට ගල්කිස්ස දිසා අධිකරණය හමුවේ විභාග වෙමින් පවතී.

**669/08/M - දිසා අධිකරණය, නුගේගොඩ - එස්.එම්.එම්.සේනානායක**

විදේශ ශිෂ්‍යත්වයක් වෙනුවෙන් දරන ලද රු. 876,235.36 ක මුදලක් ආයතනයට ගෙවිය යුතුව ඇත.

මෙම නඩුව 2013.08.06 දින කැඳවූ අවස්ථාවේදී මෙම නිලධාරියා එම මුදල වසර 05 කින් (වාරික 60 කින්) ගෙවා පියවන බවට අධිකරණයේ එකඟතාවය පරිදි එකඟවන ලදි.

**වර්තමාන තත්ත්වය**

ඉහත එකඟතාවය මත එස්.එම්.සේනානායක මහතා මෙම මුදලේ පළමු වාරිකය වන රු. 14,603.93 ක මුදල 2013.12.18 දින ආයතනයට ගෙවා ඇත.

(ආ) **කම්කරු විනිශ්චය සභාව - බී.ආර්.එම්.දයානන්ද**

මොහු විසින් සිදුකර ඇති රු. 36,000/= මූල්‍ය වංචාවක් සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා ඒ අනුව වැරදිකරු වීම මත සේවයෙන් පහකර ඇත.

මොහු අංක MH/33/208/04 දරන නඩුව ආයතනයට එරෙහිව පවරා ඇති අතර, ඒ පිළිබඳව නඩුව දැනට විභාග වෙමින් පවතී.

**වර්තමාන තත්ත්වය**

මෙම නඩුව විභාග වෙමින් පවතී.

**නිල්මිණී වික්‍රමසිංහ**

ජාතික අධ්‍යාපන ආයතනයේ පොත් හලේ දෛනික විකුණුම්වලින් 2009 වර්ෂය තුළ රු. 549,772.50 ක මුදලක් පෞද්ගලික පරිහරණය සඳහා යොදා ගැනීම සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා එහි තීරණය මත වරදකරු වූයෙන් සේවයෙන් පහකර ඇත.

ඇය අංක MH33/1005/11 දරන නඩුව ආයතනයට එරෙහිව පවරා ඇත. දැනට මෙම නඩුව විභාග වෙමින් පවතී.

**වර්තමාන තත්ත්වය**

මෙම නඩුව විභාග වෙමින් පවතී.

**WP/HCCA/MT/12/2012 RA - සිවිල් මහාධිකරණය, ගල්කිස්ස**

**කේ.ඩී.එල්.රානි මිය**

ජාතික අධ්‍යාපන ආයතනය මගින් මෙහෙයවන ලද දුරස්ථ ගුරු පුහුණු පාඨමාලා නිසි පරිදි සම්පූර්ණ කර නොමැති හෙයින් පාඨමාලා සහතිකයට හිමිකම් නොලැබූ බැවින් එය ලබා ගැනීම සඳහා ආයතනයට එරෙහිව අභියාචනාධිකරණය හමුවේ අංක 11/2007 දරන නඩුව පැවරූ අතර එහි ඇයගේ පෙත්සම නිශ්ප්‍රභා කෙරින. නැවත ඇය එම කාරණය නුගේගොඩ දිසා අධිකරණය හමුවේ අංක SPL/125/09 දරන නඩුව පැවරූ අතර එම නඩුව ද නිශ්ප්‍රභා කෙරිණ.

ඇය නැවත මේ පිළිබඳව ගල්කිස්ස සිවිල් අභියාචන මහාධිකරණය හමුවේ ඉහත අංක යටතේ නඩුව පවරා ඇත.

**වර්තමාන තත්ත්වය**

මෙම නඩුවේ ලිඛිත දේශන 2014 මැයි 28 දිනට පෙර භාරදෙන ලෙසට අධිකරණය දැනුම් දී ඇත.

4. <u>**මෙහෙයුම් සමාලෝචනය**</u>

**4.1** <u>**කාර්යය සාධනය**</u>

පිළිගත නොහැක. හේතු පහත දක්වා ඇත.

වර්ෂයේ විභාග කාල සටහන සකස් කරනුයේ පාඨමාලා පවත්වන ඒ ඒ අංශ මගින් අදාළ විභාග පැවැත්වීමට යෝජිත දින අනුව ය. කෙසේ වුව ද නියමිත දේශන අවසන් නොවීම නිසා පාඨමාලා නිසි කාලයේ දී අවසන් නොවීම හා අදාළ අභ්‍යන්තර ඇගයීම් සම්පූර්ණ නොවීම මත ඒ ඒ පාඨමාලා අංශ කරන ඉල්ලීමට අනුව විභාග කල් දැමීම සිදු වේ.

තවද ප්‍රවේශ විභාග සඳහා වර්ෂය මුලදී දින නියම කළ ද නිසි කාලයේ දී පාඨමාලා පවත්වන අංශ මගින් ඉල්ලුම් පත් කැඳවා නොමැති නිසා අදාළ දිනවල එම විභාග පැවැත්විය නොහැකි ය. එමෙන්ම ප්‍රමාණවත් ඉල්ලුම් පත් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවලදී ප්‍රවේශ විභාග අවලංගු කර සම්මුඛ පරීක්ෂණයක් පමණක් පවත්වා අදාළ බඳවා ගැනීම් සිදු කරයි. ප්‍රමාණවත් ඉල්ලුම් පත් සංඛ්‍යාවක් නොමැති විට විභාගය සඳහා අධික වියදමක් දැරීම අවශ්‍ය නොවන බැවින් එවිට ප්‍රවේශ විභාගය නොපැවැත්වේ. ඒ අනුව පහත තොරතුරු වාර්තා කරමි.

**<u>විභාග පැවැත්වීම</u>**

**ව්‍යාපෘති සහකාරවරුන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2013**

මෙය අභ්‍යන්තර කාර්ය මණ්ඩලයේ විභාගයකි. විභාගය සඳහා පාලන අංශය මඟින් ඉල්ලුම් පත් කැඳවා ඇත්තේ 2012 අවසාන කාර්තුවේ වන අතර විභාගය 2012.12.22 හා 23 දින පවත්වා ඇත.

**පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා විභාගය ( I කොටස) පුනර් විභාගය**

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (I කොටස) විභාගය ජුලි මස පැවැත්වීමට නියමිත බැවින් අමතර පුනර් විභාගයක් පැවැත්වීමට අවශ්‍ය නොවීය.

**පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ (පූර්ණ කාලීන) ඩිප්ලෝමාව**

එකම පාඨමාලාවක පූර්ණ කාලීන හා අර්ධ කාලීන සඳහා විභාග දෙකක් පැවැත්වීම අනවශ්‍ය නිසා එක විභාගයක් පාඨමාලා දෙකටම පවත්වා ඇත. පාඨමාලාව අවසන් වූ පසු 2012.09.11 - 15 දක්වා දිනවලදී අර්ධ කාලීන පාඨමාලා කණ්ඩායම සමග විභාගය පවත්වා ඇත.

**පාසල් කළමනාකරණ ඩිප්ලෝමා (ප්‍රවේශ විභාගය)**

ප්‍රමාණවත් ඉල්ලුම් පත් සංඛ්‍යාවක් නොමැතිවීමෙන් විභාගයක් නොපැවැත්වීමට තීරණය විය.

**පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමාව (ප්‍රවේශ විභාගය)**

ප්‍රමාණවත් ඉල්ලුම් පත් සංඛ්‍යාවක් නොමැතිවීමෙන් විභාගයක් නොපැවැත්වීමට තීරණය විය.

**අධ්‍යාපනපති (ප්‍රවේශ විභාගය)**

ඉල්ලුම් පත් කැඳවා ඇත්තේ 2013 ජනවාරි/ පෙබරවාරි මස වේ. ඒ අනුව 2013.04.07 දින විභාගය පවත්වා ඇත.

**අධ්‍යාපනවේදී උපාධිය (ප්‍රවේශ විභාගය) - 2013**

ඉල්ලුම් පත් කැඳවා ඇත්තේ 2013 මාර්තු මස වන අතර විභාගය 2013.06.16 දින පවත්වා ඇත.

**විශේෂ අධ්‍යාපන ඩිප්ලෝමා විභාගය - 2013**

පාඨමාලාව නියමිත කාල සීමාවේදී අවසන් නොවන බැවින් විභාගය 2013 පෙබරවාරි මස පවත්වන ලෙස පාඨමාලා අංශයෙන් ඉල්ලා තිබුණි. ඒ අනුව පෙබරවාරි මස විභාගය පවත්වා ඇත.

**සංඥා භාෂා ඩිප්ලෝමා විභාගය - 2012**

ඉහත පිළිතුර මෙයට ද අදාළ වේ.

**අතිරේක භාෂා සංවර්ධන පාඨමාලාව - 2012**

ප්‍රාදේශීය මධ්‍යස්ථාන මගින් විභාග ඉල්ලුම් පත් ලබාදීම ප්‍රමාද වීම සහ දෙසැම්බර් මස අ.පො.ස. (සා.පෙළ) විභාගය සහ එහි ඇගයීම සිදු කරන බැවින් විභාගයේ වාචික පරීක්ෂණ පෙබරවාරි 02 සහ විභාගයේ ලිඛිත පරීක්ෂණ 2013 ජනවාරි 19 දින පවත්වා ඇත.

**ප්‍රතිඵල නිකුත් කිරීම**

ජාතික අධ්‍යාපන ආයතනයේ පාඨමාලාවල ස්වභාවය අනුව වර්ෂය තුළ දී පවත්වන සියලුම පාඨමාලාවන්ට අදාළ විභාගයන්හි ප්‍රතිඵල එම වර්ෂයේදී ම නිකුත් කිරීම කළ නොහැකිය. ප්‍රතිඵල ලබා දීමට ප්‍රථම පහත ක්‍රියාමර්ග ගැනීම නිසාත්, පහත සඳහන් හේතු නිසාත් ප්‍රමාදය ඇති වී ඇත.

1. පාඨමාලාවන්හි විභාගය පැවැත්වීමෙන් අනතුරුව පැවරුම් හා පර්යේෂණ නිබන්ධන භාරදීම සඳහා අමතර කාල වකවානුවක් ලබා දීම. උදා: PGDE I සහ II

2. පශ්චාත් උපාධි ඩිප්ලෝමා - II කොටස විභාගයේ අයදුම්කරුවන් සංඛ්‍යාව 7000 කට අධික වූ අතර ඇගයීම් සිදු කර ප්‍රතිඵල නිකුත් කිරීම් කටයුතු සඳහා සුදුසුකම් ලත් පරීක්ෂකවරුන්ගේ හිඟය ද බලපා ඇත.

3. ඇතැම් පාඨමාලාවල පැවරුම් ලකුණු නියමිත පරිදි භාර දී නොතිබීම.

4. පාඨමාලාවේ ව්‍යුහය හා රෙගුලාසි සකස් කිරීමේදී විභාගය පැවැත්වීමෙන් අනතුරුව පර්යේෂණ නිබන්ධනය සඳහා කාලය වෙන් කිරීමක් සිදුකර ඇත. ඒ අනුව පාඨමාලා කාලය දීර්ඝ වේ. උදා: Dip. TESL

ඉහත තත්ත්වය යටතේ ඉදිරියේදී අවසාන විභාග පවත්වනුයේ පාඨමාලාවට අදාළ වූ සියලු දේශන, නිබන්ධන යනාදිය අවසන් වූ පසුව වේ. එමෙන්ම පැවරුම් ලකුණු විභාග අයඳුම්පත ලබා ගන්නා විටදී ම ලබා ගැනීමේ ක්‍රමවේදයක් සකස් කර ඇත.
ඒ අනුව පැවරුම් ලකුණු ඒ ඒ පාඨමාලා සම්බන්ධීකරණ නිලධාරීන් විසින් සටහන් කොට ඉල්ලුම් පත් එවිය යුතු වේ. මේ අනුව පැවරුම් ලකුණු ප්‍රමාදයෙන් ඇති වන අවසන් ප්‍රතිඵල නිකුත් කිරීම් අවහිරතාව ඉවත් වනු ඇත.

**වර්තමාන තත්ත්වය**

සියලු විභාග නිසි ලෙස පවත්වා ප්‍රතිඵල නිකුත් කර ඇත.

4.2 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

(අ) පිළිගත නොහැක.

වැඩමුළු අවශ්‍යතා සඳහා නිලධාරීන් කිහිප දෙනෙකුට ලබාදුන් අත්තිකාරම් වලින් ඉතිරි වූ මුදල් මෙසේ පියවා ඇත. වැඩමුළුවට සහභාගි වීමට නියමිත පුද්ගල සංඛ්‍යාව අනුව ඇස්තමේන්තු සකසා ඒ අනුව අත්තිකාරම් මුදල් ලබා ගනු ලැබේ. නමුත් එම සංඛ්‍යාවම සහභාගි නොවීම නිසා මුදල් ඉතිරි වීම හේතුවෙන් මෙවැනි තත්ත්වයක් උදා වී ඇත.

තවද මු.රෙ. 371 අනුව එක් අයෙකුට ලබා දිය හැකි උපරිම මුදල රු. 20,000/= බැවින් හා මීට වැඩි මුදල් ප්‍රමාණයන් ගෙවීම් කිරීමේදී අභ්‍යන්තර පාලන දුර්වලතා ඇතිවන බැවින් මෙම මුදල් සීමාව වැඩි කිරීමට මහා භාණ්ඩාගාර අනුමැතිය ඉල්ලුම් කර නැත. වැඩි වශයෙන් අත්තිකාරම් ගෙවා ඇත්තේ පිට පළාත්වල පවත්වන වැඩමුළු සඳහා ගෙවීම් කිරීම සඳහා ය.

ජාතික අධ්‍යාපන ආයතනයේ සිටින මුදල් අයකැමි වරුන් දෙදෙනාට මහරගම පරිශ්‍රයේදී දෛනික රාජකාරි කටයුතු ඉටු කිරීමට ද පැවරී ඇති බැවින් පිට පළාත්වල පවත්වනු ලබන වැඩමුළු සඳහා ගෙවීම් කිරීම සඳහා යොමු කිරීමට නොහැකි වන අවස්ථා ද තිබේ. හැකි සෑම අවස්ථාවකදීම ජාතික අධ්‍යාපන ආයතනය තුළ පවත්වනු ලබන වැඩමුළුවල ගෙවීම් කටයුතු සඳහා මුදල් අයකැමිවරයෙකු යෙදවීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

අයකැමි වරුන් ගෙවීම් කටයුතු සඳහා යෙදවීමට නොහැකි අවස්ථාවලදී පමණක් අදාළ නිලධාරීන්ට අත්තිකාරම් ලබා දීමට අවශ්‍ය කටයුතු කරනු ලබන බව ද කාරුණිකව දන්වා සිටිමි.

තවද ලබා දෙන අත්තිකාරම් මුදලින් ඉතිරිවන මුදල් දින 3 ක් ඇතුළත තැන්පත් කිරීමට කටයුතු නොකළහොත් එම මුදල සඳහා වන දඩ මුදල් ද සමඟ වැටුපෙන් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. මෙම ක්‍රියාමාර්ගය තුළින් අත්තිකාරම් ක්‍රියාවලිය පාලනය කර ඇත.

**වර්තමාන තත්ත්වය**

අත්තිකාරම් ක්‍රියාවලිය පාලනය කිරීමට පියවර ගෙන ඇත.

(ආ) පිළිගත නොහැක.

මුදල් අයකර ගැනීම සඳහා කටයුතු කර ඇත. මේ වන විට අදාළ නිලධාරිනියගෙන් ආයතනයට අයවිය යුතු මුදල නිවැරදිව ගණනය කර ඇති අතර එම මුදල් අයකර ගැනීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනය විසින් 2012.10.05 දින නීතිපතිවරයා වෙත මෙම නිලධාරිනියට එරෙහිව නඩු පැවරීමට යොමු කර ඇත.

**වර්තමාන තත්ත්වය**

B.K. විජේගුණවර්ධන මියගෙන් මෙම මුදල් අයකර ගැනීම සඳහා 2013.11.15 දින නීතිපති දෙපාර්තමේන්තුව මගින් එන්තරවාසි නිකුත් කර ඇත.

4.3 <u>නිෂ්ක්‍රීය ඌණ උපයෝජිත වත්කම්</u>

එකඟ නොවෙමි. මේ සඳහා රු. 11,700,000/= ක් වටිනාකමකින් යුත් පොත් මුද්‍රණය කළ අතර දැනට ඉතිරි වී ඇත්තේ රු. 2,111,775/= වටිනාකමකින් යුත් පොත් පමණි. මේවා ද ඉදිරියේදී විකිණීමට කටයුතු කර ඇත. අදාළ පාඨමාලා ලාභීන්ට ජාතික අධ්‍යාපන ආයතනයේ ප්‍රකාශන ගබඩාවෙන් මුදල් ගෙවා ලබා ගැනීමට පහසුකම් සලසා ඇත.

**වර්තමාන තත්ත්වය**

දැනට මෙම පොත් ප්‍රකාශන ගබඩාව මගින් අලෙවි කරනු ලැබේ.

4.4 <u>කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු</u>

ප්‍රතිපාදන ඉල්ලුම් කලත් මෙතෙක් ප්‍රතිපාදන ලබා ගැනීමට නොහැකි වීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය අවලංගු කර තිබුණි. කෙරීගෙන යන වැඩ යටතේ පෙන්නුම් කර ඇති මෙම රු. 1,200,949/33 ක මුදල නිශ්කාර්ය වියදමක් ලෙස සලකා ගිණුම්වලින් ඉවත් කිරීම සඳහා පළමුව ආයතන සභා අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති අතර ඉන් අනතුරුව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන කපා හැරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ.

**වර්තමාන තත්ත්වය**

මේ සඳහා ආයතන සභා අනුමැතිය 2013.10.31 දින ලබාගෙන ඇත. අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් මගින් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට 2013.12.12 දින කටයුතු කර ඇත.

4.5 <u>ප්‍රමාද වූ ව්‍යාපෘති</u>

(අ) පිළිගත නොහැක.

මේ සඳහා කිසිදු ගෙවීමක් සිදුකර නැත. ඔහු කාර්යය නියි පරිදි ඉටු නොකිරීම නිසා කාර්ය සංසිද්ධි ඇපකරය වූ රු. 11,500/= ආයතනය සතු කරගෙන ඇත. නැවත මිල ගණන් කැඳවා ඇති අතර එම කාර්යය සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ලැබේ.

උක්ත කාර්යය සඳහා 2011.08.01 දින කාර්ය ප්‍රදාන ලිපිය ලබා දී කාර්යය ආරම්භ කිරීමට කටයුතු කර තිබුණ ද පසුව ගිවිසුමක් අත්සන් කිරීමට තීරණය වූ බැවින් ගිවිසුම අත්සන් කළ දින සිට සති දෙකක් කොන්ත්‍රාත් කාලය වශයෙන් සලකා ඇත.

ඒ අනුව ගිවිසුම අත්සන් කළ දිනය 2011.08.17 වන අතර කාර්යය අවසන් කළ යුතු දිනය 2011.08.30 වේ.

**වර්තමාන තත්ත්වය**

දැනට කාර්ය අවසන් කර ඇත.

(ආ) **වෙල්යායට මායිම් කොටස කටු කම්බි ගැසීම**

පිළිගත නොහැක.

පසුව අනාවරණය වූ තොරතුරු අනුව අවම මිල ඉදිරිපත් කර තිබූ දිල්ෂාන් එන්ටර්ප්‍රයිසස් ආයතනය වෙත කාර්ය ප්‍රධානය කිරීම සඳහා නැවත ප්‍රසම්පාදන කමිටු අනුමැතියට ඉදිරිපත් කරන ලදි. එම අවස්ථාවේදී කලින් සිදුකර තිබූ ටෙන්ඩර් ප්‍රදානය අවලංගු කර ඇත.

මේ අනුව 2013 වසරේ ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුව මෙම කාර්ය ඉටු කිරීමට සැලසුම් කර තිබුණි.

**වර්තමාන තත්ත්වය**

මුදල් ප්‍රතිපාදන නොමැති නිසා මෙම කාර්ය ඉටු කිරීමට නොහැකි වී ඇත.

## 5. <u>ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය</u>

### 5.1 <u>ක්‍රියාකාරී සැලැස්ම</u>

**භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා**

වාර්ෂික සැලැස්මට අනුව මෙම වැඩමුළු වර්ෂය ආරම්භයේ සිටම ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබූ නමුත් TSEP මුදල් ලැබීම සිදු වූයේ ඔක්තෝබර් මස අගදී බැවින් මෙම වැඩමුළු පැවැත්වීමට නොහැකි වී ඇත. මෙය ආයතනයේ අකාර්යක්ෂමතාවයක් නොවේ.

**විද්‍යා හා තාක්ෂණ පීඨය**

ඉහත පිළිතුර මෙයට ද අදාළ වේ.

**සැලසුම් පර්යේෂණ හා ගුරු අධ්‍යාපන පීඨය**

ඉහත පිළිතුර මෙයට ද අදාළ වේ.

**විකල්ප අධ්‍යාපන හා ගුරු අධ්‍යාපන පීඨය**

ඉහත පිළිතුර මෙයට ද අදාළ වේ.

5.2 <u>අයවැය පාලනය</u>

පිළිගත නොහැක. එක් එක් වෙනස්වීම් පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

**කමිටු දීමනා**

පැමිණීම හා පවත්වන ලද කමිටු වාර ගණන මත මෙම වියදම තීරණය වී ඇති බැවින් අයවැය ගත ප්‍රමාණයට වඩා අඩුවෙන් වියදම් කර ඇත.

**ගමන් වියදම් (දේශීය)**

බාහිර ගමන් සීමා කිරීම හේතුවෙන් මෙම වියදම අඩු වී ඇත.

**ගමන් වියදම් (විදේශීය)**

මුදල් ලබා ගැනීම ප්‍රමාදවීම නිසා සැලසුම් කල විදේශීය කාර්ය මණ්ඩල පුහුණු වැඩ සටහන් නියමිත පරිදි ඉටු කිරීමට නොහැකි වීම හේතුවෙන් මෙම වියදම අඩු වී ඇත.

**ලිපි ද්‍රව්‍ය කාර්යාලීය අවශ්‍යතා හා මුද්‍රණය**

තොග පාලනය කිරීම මත මිල දී ගැනීම් සීමා කිරීම නිසා මෙම අවශ්‍යතා හා මුද්‍රණ වියදම අඩු වී ඇත.

**ආහාර**

ආහාර සැපයීම සීමා කිරීම හේතුවෙන් මෙම වියදම අඩු වී ඇත.

**වෛද්‍ය පහසුකම්**

වසර තුළ බඳවා ගැනීම්වලට අනුව ඉල්ලුම් කර ඇති වෛද්‍ය පරීක්ෂණ ගාස්තු මුදල අනුව වියදම් වූ මුදල වේ.

**යන්ත්‍ර හා විදුලි උපකරණ**

මේ යටතේ වූ ප්‍රතිපාදන මුදල වැය කර ඇත්තේ යන්ත්‍රෝපකරණ හා උපකරණ අලුත්වැඩියා හා නඩත්තු වෙනුවෙනි.

**වෙනත් ඉගෙනුම් ද්‍රව්‍ය**

වියදම් පාලනය කිරීම තුළින් ඇති වූ තත්ත්වයකි.

**පුවත්පත් හා සඟරා**

මුදලින් කරන වියදම් පමණක් නොව, මෙම වියදම් තුළ පසුගිය වසරේ ගෙවිය යුතු වියදම් ද ඇතුළත්ව තිබීමෙන් මෙම තත්ත්වය ඇති වී තිබේ.

**බදු වියදම**

මිල දී ගැනීම්වලට අදාළ වන vat වියදම ගිණුම්වලට අදාළ වන පරිදි වර්ගීකරණය කර බදු වියදම් වශයෙන් පෙන්වා ඇති අතර අය වැය පාලනයේ දී මිලදී ගැනීම් වැය ශීර්ෂ යටතේ අන්තර්ගත වී ඇත.

**<u>අළුත්වැඩියා නඩත්තු වියදම්</u>**

**වාහන**

වාහනවල ආයුකාල ගෙවී ගොස් ඇති නිසා වාහනවල නඩත්තු වියදම් වැඩි වී ඇත.

**යන්ත්‍රෝපකරණ හා උපකරණ**

මේ යටතේ වෙන්කර ඇති ප්‍රතිපාදන මුදලට ඉහත යන්ත්‍ර හා විදුලි උපකරණ යටතේ ඇති ප්‍රතිපාදන මුදල එකතු කළ යුතුය. එවිට වැඩිපුර වියදම් දරා ඇත්තේ රු. 981,744/= ක් පමණි.

**ගොඩනැගිලි**

මේ යටතේ ඇති තත්‍ය වියදම් තුළ මූලධන ප්‍රතිපාදන තුළ ඇති පුනරාවර්තන හා වැඩිදියුණු කිරීම්වලට අයත් ප්‍රතිපාදන වලින් කරන ලද වියදම් ද ඇතුලත් වීම තුළින් මෙම තත්ත්වය ඇති වී තිබේ.

**වෙනත් ලී බඩු හා උපකරණ**

වියදම් සීමා කිරීම් මත වියදම අඩු වී ඇත.

**<u>තැපැල් හා ප්‍රචාරණ</u>**

අවසන් ගිණුම් සකස් කිරීමේදී තත්‍ය ශේෂය සකස් වී ඇත්තේ පහත සඳහන් පරිදිය.

| | | |
|---|---|---|
| තැපැල් හා විදුලි පණිවුඩ | - | රු. 728,164.00 |
| ප්‍රචාරණ වියදම් | - | රු. 1,184,713.80 |
| | | රු. 1,912,877.80 |
| | | ============ |

මේ අනුව තැපැල් හා විදුලි පණිවුඩ වියදම් ගිණුමේ හා ප්‍රචාරණ වියදම් ගිණුම් දෙකෙහි එකතුව මෙම ශීර්ෂය යටතේ සඳහන් විය යුතුය. ඒ අනුව රු. 147,122.20 ඉතිරියක් පමණක් ඇත.

**බැංකු ගාස්තු, පොලී හා විගණන ගාස්තු**

මෙම මුදල ඇස්තමේන්තු ගත කර තිබුණේ සත්‍ය විගණන ගාස්තු වියදම් නොදන්නා බැවිනි. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ බිල්පත ලද පසු මෙම වියදම ගෙවීම හේතුවෙන් මෙම වෙනස සිදුවී ඇත.

**බලපත්‍ර ගාස්තු ලියාපදිංචි හා රක්ෂණ ගාස්තු**

සැලසුම් ගත මුදලට වඩා රක්ෂණ ගාස්තු ඉහළ යාම නිසා මෙවැනි තත්ත්වයක් උදා වී ඇත.

**කෑලි පදනම මත ගෙවීම**

මෙම තථ්‍ය වියදම් තුළ 2012/12/31 දිනට ගෙවිය යුතු උපචිත වියදම් ඇතුළත්වී ඇත.

**සම්පත්දායක දීමනා**

මෙම තථ්‍ය වියදම් තුළ 2012/12/31 දිනට ගෙවිය යුතු උපචිත වියදම් ඇතුළත්වී ඇත.

**සේවක සංවර්ධනය**

මෙම ප්‍රතිපාදන මුදලට අදාළ මුදල් ප්‍රමාද වී ලැබීම හේතුවෙන් සැලසුම් කළ වැඩ සටහන් ක්‍රියාත්මක වී නැත. එම මුදල් යොදා ගනිමින් 2013 වසර නිමවීමට පෙර අදාළ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත.

**සේවක සුභ සාධනය**

ආයතනයේ නව රක්ෂණ ක්‍රමයක් ඇති කිරීම තුළින් මෙම තත්වය උදා වී ඇත. ඒ තුළින් වර්ෂය තුළදී කළ රක්ෂණ ගෙවීම් වලට අමතරව වර්ෂයේ වෙන් කරන ලද මුදලද මේ තුළ අන්තර් ගත වී ඇති බැවින් වියදම ඉහළ ගොස් ඇත. වෙන් කරන ලද මුදල රක්ෂණ තැන්පත් ගිණුමේ පෙන්වා ඇත.

**සේවක ණය අරමුදල**

සේවක ණය අරමුදලේ ප්‍රමාණවත් ශේෂයක් තිබූ බැවින් මෙම මුදලින් ගෙවීම් කර නොමැත.

**වෙනත් විවිධ වියදම් ආරක්ෂක සේවා, පවිත්‍රතා සේවා, සංග්‍රහ වියදම්**

වියදම් පාලනය කිරීම තුළින් ඇති වූ තත්ත්වයකි.

**තැන්පතු වියදම්, නේවාසිකාගාර, පෙර පාසල් වියදම්**

මේ සඳහා ප්‍රතිපාදන අයවැය ලේඛනයට ඇතුළත් කර නැත. ලද ආදායම් මුදලින් වියදම් දරා ඇත.

**පරිභෝජන ද්‍රව්‍ය**

ගිණුම් වාර්තා සකස් කිරීමට අදාළ වන පරිදි වර්ග කිරීමක් වේ. ආයතනයේ විවිධ වැය ශීර්ෂ යටතේ මිලදී ගත් භාණ්ඩ මෙලෙස වර්ග කර ඇත.

**වර්තමාන තත්ත්වය**

අයවැය ලේඛනය සකස් කරනු ලබන්නේ මුදල් පදනම මතය. නමුත් තත්‍ය වියදම ගිණුම් ගත කර ඇත්තේ උපචිත පදනම මතය. ඉදිරියේදී සෑම මාස 3 කට වරක්ම විචලන අධ්‍යයනයක් කිරීමට කටයුතු කරනු ලැබේ.

6. <u>**පද්ධති හා පාලන**</u>

(අ) **වත්කම් හා ගබඩා පාලනය**

විධිමත් කිරීමට අවශ්‍ය කටයුතු කර ඇත.

(ආ) **පොත් හා ග්‍රන්ථ මුද්‍රණය**

අධ්‍යාපන ග්‍රන්ථ හා ගුරු අත්පොත් පොත්, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් මුද්‍රණය කරන බැවින් මෙම අඩුපාඩුව ඇති වී නොමැත.

(ඇ) **අයවැය පාලනය**

අයවැය ලේඛනය සකස් කරනු ලබන්නේ මුදල් පදනම මතය. නමුත් තත්‍ය වියදම ගිණුම් ගත කර ඇත්තේ උපචිත පදනම මතය. මේ නිසා අයවැය පාලනයේ වෙනස්කම් ඇති වේ. ඉදිරියේදී සෑම මාස 3 කට වරක්ම විචලන අධ්‍යයනයක් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඈ) **අධ්‍යයන කටයුතු සඳහා විදේශ ගමන්**

විධිමත් කර ඇත. පරිවාස කාලය තුළ සිටින කිසිවෙකු සඳහා විදේශ ශිෂ්‍යත්ව ලබා නොදෙන බැවින් මෙවැනි අඩුපාඩු ඇති නොවේ.

(ඉ) **විභාග පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම**

විධිමත් කර ඇත.

(ඊ) **ප්‍රසම්පාදනය**

මෙය කෙටුම්පත් විගණන වාර්තාවේ සඳහන් වී නොතිබුණි. විධිමත් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

**වර්තමාන තත්ත්වය**

මෙම ක්ෂේත්‍රයන් ඵලදායී ලෙස යෙදවීමට මේ වන විට දැඩි පාලනයකින් කටයුතු යොදා ඇත.

මහාචාර්ය ඩබ්.එම්.අබේරත්න බණ්ඩාර,
අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික අධ්‍යාපන ආයතනය,
මහරගම.

ඇමුණුම - 01

# ජාතික අධ්‍යාපන ආයතනය
# தேசிய கல்வி நிறுவகம்
# NATIONAL INSTITUTE OF EDUCATION

තැ.පෙ. 21, හයිලෙවල් පාර, මහරගම
த.பெ. 21, ஹைலெவல் வீதி, மகரகம
P.O. Box 21, High Level Road, Maharagama, Sri Lanka

අපේ යොමුව: / எமது கோவை: / Our Reference: NIE/ED/A/C/P1

ඔබේ යොමුව: / தங்கள் கோவை: / Your Reference:

දිනය: / திகதி: / Date: 11/03/201

ලේකම් මඟින්,
(අධ්‍යාපන අමාත්‍යංශය)
අධ්‍යක්ෂ ජනරාල්,
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව,
මහාභාණ්ඩාගාරය,
කොළඹ.

**2012 - ගිණුම් වර්ෂයෙන් අවසන් ගිණුම්වලින්**
**බොල්ණය කපාහැරීම**

2008 වර්ෂයේ සිට ජාතික අධ්‍යාපන ආයතනයේ අවසන් ගිණුම්වල දිගින් දිගටම අධ්‍යාපන අමාත්‍යංශයෙන් ලැබිය යුතු යැයි පෙන්නුම් කරන ලද මුදල (රු.3,237,799,66) කි.

මෙම මුදල තවදුරටත් අයකර ගැනීමට හැකියාවක් නොමැති බැවින්, එම ලැබිය යුතු ශේෂය කපා හැරීම සම්බන්ධව ආයතන සභාවේ අනුමැතිය ලබා දී ඇති අතර, (එම අනුමැතියේ පිටපතක් අවශ්‍ය කටයුතු සඳහා ඉදිරිපත් කරමි.) එම අනුමැතිය මහාභාණ්ඩාගාරයේ ආවරණය අනුමැතිය ලබාගැනීම සඳහා කාරුණිකව ඉලදිරිපත් කරමි.

..............................

මහාචාර්ය ඩබ්ලිව්.එම්.අබේරත්න බණ්ඩාර
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

භාර ගනිමි.
13/4/26

ඇමුණුම -02


දුරකථන/தொலைபேசி இல./Telephone Nos.
අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832 2784807 2785617
ලේකම් / செயலாளர் / Secretary } 2784812
කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50 Fax: 2784846
ඊමේල්/ஈ–மெயில்/E-mail :info@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education
"ඉසුරුපාය", ශ්‍රී ජයවර්ධනපුර බත්තරමුල්ල
'இசுருபாயா' ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Battaramulla.


ඔබේ අංකය / உமது இல. / Your No. }

මගේ අංකය / எமது இல. / My No. } ජව/5/78/3/8

දිනය / திகதி / Date } 2013.09.09

අධ්‍යක්ෂ ජනරාල්,
කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය

**2012 ගිණුම් වර්ෂයෙන් අවසන් ගිණුම් වලින් බොල්ණය කපාහැරීම.**

උක්ත කරුණ පිළිබඳ ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ NIE/ED/A/C/P1 හා 2013.03.11 දිනැති ලිපිය හා බැදේ.(පිටපත අමුණා ඇත)

ඒ අනුව 2008 වර්ෂයේ සිට ජාතික අධ්‍යාපන ආයතනයේ අවසන් ගිණුම් වල දිගින් දිගටම අයවිය යුතු ලෙස පෙන්නුම් කරන රු.3,237,799.66 ක මුදල අවසන් ගිණුම් වලින් බොල්ණය ලෙස කපාහැරීම සඳහා අනුමැතිය ලබාදෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

අනුර දිසානායක,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

පිටපත: අධ්‍යක්ෂ ජනරාල් , ජාතික අධ්‍යාපන ආයතනය - දැ.ගැ.ස.

ඇමුණුම - 03

# ජාතික අධ්‍යාපන ආයතනය
# தேசிய கல்வி நிறுவகம்
# NATIONAL INSTITUTE OF EDUCATION

තැ.පෙ. 21, හයිලෙවල් පාර, මහරගම
த.பெ. 21, ஹைலெவல் வீதி, மகரகம
P.O. Box 21, High Level Road, Maharagama, Sri Lanka

අපේ යොමුව: / எமது கோவை: / Our Reference: NIE/FD/BK/AC/2013

ඔබේ යොමුව: / தங்கள் கோவை: / Your Reference:

දිනය: / திகதி: / Date: 2013.10.09

ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය
බත්තරමුල්ල

**2012 ගිණුම් වර්ෂයේ අවසන් ගිණුම්වලින් බොල් ණය කපා හැරීම**

යතෝක්ථ සිරස්තලයෙන් යුක්තව යොමු අංක NIE/ED/A/C/P1 හා 2013.03.11 දිනැතිව ඔබ වෙත යොමුකරන ලද ලිපිය හා බැඳේ. ඒ අනුව ඔබ විසින් මහාභාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු අංක ED/5/78/3/8 හා 2013.09.09 දිනැති ලිපිය මගින් රු.3,237,799.66 ක මුදල බොල්ණය ලෙස කපා හැරීම සඳහා අනුමැතිය ඉල්ලා ඇත. (පිටපත් අමුණා ඇත.)

අවසන් ගිණුම්වලින් මෙම මුදල බොල්ණය ලෙස කපා හැරීම සඳහා මහාභාණ්ඩාගාරයේ, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාගැනීම සඳහා යොමුකල යුතු බව 2013.09.03 දින ජාතික අධ්‍යාපන ආයතනයේ පැවති 47 වන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී සඳහන් කරන ලදී.

එබැවින් මෙම මුදල කපා හැරීම සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාදීමට කටයුතු සලසා දෙන ලෙස කාරුණිකව ඉල්ලමි.

මහාචාර්ය ඩබ්.එම්. අබේරත්න බණ්ඩාර
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

ඇමුණුම - 04

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
முகாமைத்துவ சேவைகள் திணைக்களம்
DEPARTMENT OF MANAGEMENT SERVICES
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் அமைச்சு
MINISTRY OF FINANCE & PLANNING
මහා භාණ්ඩාගාරය, කොළඹ 01. பொது திறைசேரி, கொழும்பு-01. General Treasury, Colombo 01.

මගේ අංකය / எனது இல. / My No. DMS/B1/37/03/VOL III

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2013.10.08

10 OCT 2013
132
2481
අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය

අධ්‍යක්ෂ ජනරාල්

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව

ප්‍රිය මහත්මයාණෙනි

**<u>2012 ගිණුම් වර්ෂයෙන් අවසන් ගිණුම්වලින් බොල්ණය කපා හැරීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් මා ඇමතූ අංක ඊඩී/5/78/3/8 හා 2013.09.09 දිනැති ලිපියේ පිටපත් මේ සමග අමුණා ඇත.

02) එකී ලිපියේ සඳහන් ඉල්ලීම ඔබ දෙපාර්තමේන්තුවේ විෂය පථයට අයත් බැවින් අවශ්‍ය කටයුතු සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

මෙයට - විශ්වාසී

එන්. ගොඩකන්ද
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :

1) ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස
2) අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය - කරු. දැ.ගැ.ස

11 OCT 2013

11/10/13

ඇමුණුම 05

Original

1286

94

ලදුපත් අංකය / பற்றுச்சீட்டு இல. / Receipt No. 11997

දිනය / திகதி / Date 98/11/11

# ජාතික අධ්‍යාපන ආයතනය
# தேசிய கல்வி நிறுவகம்
# National Institute of Education

## මුදල් භාර ගැනීමේ කුවිතාන්සිය
## பணம் பெற்றுக் கொண்டதற்கான பற்றுச்சீட்டு
## Cash Receipt

1. වැඩ සටහන / நிகழ்ச்சித் திட்டம் / Programme :
2. මුදල් ගෙවූ අය / பணம் செலுத்தியவர் / Received from : G. A. K. [illegible]
3. භාරගත් මුදල / பெற்றுக் கொண்ட பணம் / The amount received : [illegible]
4. රු. / ரூ. / Rs. : 18621/10
5. කාරණය / காரணம் / Reason : [illegible]
6. රාජකාරි ලිපි යොමුව / உத்தியோகபூர்வ கடிதக் குறிப்பு / Official letters reference :
7. ගෙවීම් වව්චරයේ අංකය / கொடுப்பனவு வவுச்சர் இல / No. of paying in voucher : 01/85 - 12% — 1464.00; 01 [illegible] 3% — 366.00; [illegible] — 16306.00
8. චෙක්පතෙහි / මුදල් ඇණවුමෙහි අංකය හා දිනය / காசோலையின் / காசுக் கட்டளையின் இலக்கமும் திகதியும் / Cheque / M. O. No. & date : [illegible] — 485.10

   Total: 18621.10
9. ගෙවන්නාගේ ලිපිනය / செலுத்துபவரின் முகவரி / Address of payer : 277, [illegible]

ඉහත සඳහන් මුදල් භාර ගත්තෙමි / மேலே குறிப்பிட்ட பணத்தைப் பெற்றுக் கொண்டேன் / Received the above amount

මුදල් අයකැමි / காசாளர் / Cashier

# මූල්‍ය වාර්තාවලට සටහන්

## 1. හඳුනාගත් ගිණුම් ප්‍රතිපත්ති

### 1.1 පොදු :

ප්‍රකාශයට පත්කරන ලද ආයතනයේ මූල්‍ය ප්‍රතිඵල හා තත්ත්වය පිළිගත් ගණකාධිකරණ මූලධර්ම හා ප්‍රතිපත්තිවලට අනුකූලව ඓතිහාසික පිරිවැය මත ගණනය කරනු ලබන අතර ඒවා මින් පෙර භාවිත කළ ප්‍රතිපත්ති හා අනුරූප වෙයි.

### 1.2

සියළුම විදේශීය විනිමය ගණුදෙනු ඒවා සිදුවන අවස්ථාවේ පැවැති විනිමය අනුපාත මත පරිවර්තනය කරනු ලැබේ.

### 1.3 වත්කම් හා ඒවා අගය කිරීමේ පදනම

#### 1.3.1 ණය ගැතියෝ හා අනිකුත් ලැබිය යුතු දෑ

ලැබිය යුතු දෑ ගණනය කර ඇත්තේ එහි අන්තර්ගත උපලබ්ධි අගය මත ය. අයකර ගැනීමට නොහැකි එනම් අනුමාන කරන ප්‍රමාණයන් ගණනය කර ඇත්තේ වර්ෂය අවසානයේ ලැබිය යුතු වටිනාකම් පදනම් කර ගෙන ය.

#### 1.3.2 දේපල පිරියත සහ උපකරණ සහ ක්ෂයවීම්

ස්පෘශ්‍ය වත්කම් පෙන්වා ඇත්තේ පිරිවැය හෝ නැවත අගය කළ වටිනාකමින් සමුච්චිත අගය අඩු කිරීමෙනි. වත්කම් අත්පත් කරගන්නා අවස්ථාවේ අත්පත් කර ගැනීමට විශේෂිත වූ වියදම පිරිවැය තුළ අඩංගු වේ. ක්ෂයවීම් ප්‍රමාණය ආදායම් ගිණුමෙන් කපා හැර ඇත්තේ පහත විස්තර වන අනුප්‍රමාණයන්ට අනුව එනම් හීනවන වාරික ක්‍රමය මත වත්කම්වල ප්‍රමාණවත් ආයු කාලය සැලකිල්ලට ගනිමිනි.

දේපල පිරියත හා උපකරණ වර්ෂය තුළ ක්ෂය කර ඇත්තේ පහත සඳහන් පරිදි ය :

| | |
|---|---|
| කාර්යාලීය ලී බඩු හා උපකරණ | 10% |
| පරිගණක උපකරණ | 33 1/3% |
| පුස්තකාල පොත් හා සඟරා | 10% |
| යතුරුපැදි හා පාපැදි | 20% |
| යන්ත්‍ර හා පිරියත | 10% |
| මෝටර් රථවාහන | 20% |
| ගොඩනැගිලි | 5% |
| ඡායා පිටපත් යන්ත්‍ර | 10% |

1.3.3 තොග

නොග පිරිවැය ගණනය කරනු ලබන්නේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට ය.

1.3.4 මුදල් හා මුදල් හා සමාන දෑ

මුදල් හා මුදල් හා සමාන දෑ වශයෙන් ඇතුලත් වන්නේ බැංකුවේ හා අත ඉතිරි මුදල්, මාර්ගස්ථ මුදල් යනාදිය.

1.3.5 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය වක්‍ර ක්‍රමය මත පිළියෙල කර ඇත. (Indirect Method)

1.4 ප්‍රදාන ගිණුම්ගත කිරීම

ආයතනයේ වියදම් ප්‍රතිපූරණය සඳහා ලද ප්‍රදාන ආදායම් ප්‍රකාශයේ දී විධිමත් පදනමක් මත වියදම් දැරූ කාල පරිච්ඡේදය සඳහා වූ ආදායම ලෙස සලකනු ලැබේ.

ආයතනයේ ප්‍රාග්ධන වියදම් ප්‍රතිපූර්ණය සඳහා ලැබෙන ප්‍රදාන ප්‍රාග්ධනගත කරනු ලබන අතර එය විධිමත් පදනමක් මත අදාළ වත්කමෙහි ඵලදායී ජීවිත කාලය පුරා ආදායමක් ලෙස සලකනු ලැබේ.

1.5 සේවක ප්‍රතිලාභ

1.5.1 සේවක පාරිතෝෂික සඳහා වෙන් කිරීම

සේවා කාලය වසර පහ සම්පූර්ණ කල සේවකයින්ට ගෙවිය යුතු විශ්‍රාම ප්‍රතිලාභ සඳහා වෙන් කිරීම් කර ඇත්තේ 1983 අංක 12 දරන විශ්‍රාම ප්‍රතිලාභ පනත යටතේය.

මෙම බැරකම සඳහා පිටත අරමුදල් ආයෝජනය කර නොමැති අතර පිරිවැය සත්‍ය වශයෙන් ගණනය කර නොමැත.

1.5.2 නිර්වචිත දායක සැලසුම්

සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදලේ දායකත්වය සඳහා වන බැඳීම් ආදායම් ප්‍රකාශයේ දී දරණ ලද වියදමක් ලෙස දක්වා ඇත.

1.6 ජංගම බැරකම්

ශේෂ පත්‍ර දිනයේ සිට වසරක් ඇතුළත ගෙවීමට සිදුවිය හැකි හා ඉල්ලුම් කරනු ලැබිය හැකි දේ ජංගම බැරකම් වේ. ශේෂ පත්‍ර දිනයේ සිට වසරකට හෝ ඊට වඩා වැඩි කාලයක දී ගෙවීමට සිදුවිය හැකි දෑ ජංගම නොවන බැරකම් වේ.

1.7 ශේෂ පත්‍ර දිනට පසුව සිදුවන සිද්ධීන්

ශේෂ පත්‍ර දිනට පසුව සිදු වූ ප්‍රමාණාත්මකව සිදුවීම් සලකා බලනු ලබන අතර අවශ්‍ය අවස්ථාවන්හි දී ගිණුම්වල සුදුසු ගැලපුම් කර ඇත.

1.8 ආදායම් හා වියදම්

1.8.1 ආදායම් හඳුනාගැනීම

i පුනරාවර්තන සඳහා රජයේ ප්‍රදාන මුදල් පදනම යටතේ ආදායම් හා වියදම් වාර්තාවල හඳුනාගෙන ඇත. ප්‍රකාශන අලෙවිය, ලැබූ නේවාසිකාගාර ගාස්තු, පාඨමාලා ගාස්තු සහ විභාග ගාස්තු සහ විවිධ ආදායම් ආදිය ශිෂ්‍යයන්ගෙන් ලැබූ ගාස්තු ශිෂ්‍යන්ගෙන් ලැබූ ආදායම් ලැබීම් මත පමණක් ආදායම ලෙස සලකා ඇත.

ii විභාග සම්මන්ත්‍රණ පාඨමාලා මත වූ අතිරික්ත / ඌනතාවය සහ අධ්‍යාපන හා සාමාජික ක්‍රියාකාරකම් නිම වූ වර්ෂයේ ආදායම් ගිණුම්වලට ගනු ලැබේ.

1.8.2 වියදම්

i ආයතනය පැවැත්ම සහ ප්‍රාග්ධන වත්කම් ක්‍රියාකාරිත්වයේ පවත්වා ගැනීම සඳහා සියළු වියදම් වර්ෂයේ අතිරික්තය ඌනතාවය ලබාගැනීමේ දී අදාළ ආදායමට ගලපා ඇත.

ii ආයතනයේ ඉපයීමේ ධාරිතාවය පවත්වාගෙන යාමට හෝ වැඩි කිරීමේලා ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීමේ දීර්ඝ කිරීම් හෝ වැඩිදියුණු කිරීම සඳහා දරන ලද සියළු වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ.

1.9 අසම්භාව්‍යත්

පහත සඳහන් නඩු උසාවියේ පවතින බැවින් වගකීම් වටිනාකම ස්ථිර නොවන බැවින් ඒ සඳහා වෙන් කිරීම් කළ නොහැක.

1.9.1

| | |
|---|---|
| 1. අංක 780 /09/m/ මුදල් | රු. 2,237,337 |
| 2. අංක 4801 / 05 / මුදල් | රු. 2,947,755 |
| 3. ඒ.පී.එස්.එස්. පතිරණ මයා | රු. 4,056,527 |
| 4. එස්.එම්.එම්. සේනානායක මයා | රු. 876,235 |

1.9.2 පහත සඳහන් පුද්ගලයින් වෙනුවෙන් නීති ක්‍රියාමාර්ග ගැනීම සිදුවෙමින් පවතී.

| | |
|---|---|
| 1. කේ.ඩබ්.පී.ඒ. වීරවර්ධන මිය | රු. 202,728 |

1.9.3 තොග සමීක්ෂණයේදී හිඟයක් ලෙස හඳුනාගත් රු. 202,189.60 ක් වටිනා වත්කම් සඳහා පරීක්ෂණ කටයුතු සිදුවෙමින් පවතී.

ජාතික අධ්‍යාපන ආයතනය

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව

| | සටහන් | 2012 රු. ශත | 2011 රු. ශත |
|---|---|---|---|
| වත්කම් | | | |
| දේපල යන්ත්‍රසූත්‍ර හා පිරියත | 1 | 749,147,713.85 | 731,455,431.10 |
| එකතු කළා - කෙරීගෙන යන වැඩ | 1-A | 1,200,949.33 | 6,652,325.99 |
| | | 750,348,663.18 | 738,107,757.09 |
| ජංගම වත්කම් | | | |
| තොගය / පවතින බඩු | 2, 2A | 46,041,376.76 | 21,735,420.14 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | 3, 3A | 73,051,898.05 | 69,625,866.53 |
| කලින් ගෙවුම් | 4 | 43,505.50 | 908,202.92 |
| කෙටිකාලීන ආයෝජන | 5 | 122,535,876.13 | 120,000,000.00 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | 5A | 48,488,153.82 | 61,507,669.44 |
| | | 290,160,810.26 | 273,777,159.03 |
| මුළු වත්කම් | | 1,040,509,473.44 | 1,011,884,916.12 |
| බැරකම් | | | |
| ජංගම බැරකම් | | | |
| උපචිත වියදම් | 6 | 21,541,107.37 | 26,676,630.10 |
| කලින් ලැබුණු පාඨමාලා ගාස්තු | 7 | 27,958,588.12 | 38,325,000.00 |
| | | 49,499,695.49 | 65,001,630.10 |
| ජංගම නොවන වගකීම් | | | |
| සේවක පාරිතෝෂික සඳහා වෙන් කිරීම් | 8 | 71,071,320.87 | 71,720,527.95 |
| මුළු වගකීම් | | 120,571,016.36 | 136,722,158.05 |
| ශුද්ධ වත්කම්වල එකතුව | | 919,938,457.08 | 875,162,758.07 |
| ශුද්ධ වත්කම් / සාධාරණත්වය | | | |
| සමුච්චිත අරමුදල | 9 | (384,060,691.18) | (366,010,719.66) |
| ප්‍රාග්ධන සංචිත සහ ප්‍රදාන | 10 | 1,014,155,034.53 | 952,009,253.23 |
| ණය අරමුදල | 11 | 57,925,626.48 | 55,377,949.50 |
| ප්‍රත්‍යා ගණන සංචිත අරමුදල | 12 | 231,918,487.25 | 233,786,275.00 |
| මුළු ශුද්ධ වත්කම් | | 919,938,457.08 | 875,162,758.07 |

මූල්‍ය වාර්තාවට අදාල ගණකාධිකරණ ප්‍රමිත හා සටහන් පිටු අංක 03 සිට 05 දක්වා අදාල වේ.

නිවැරදි බවට නිර්දේශ කළේ : අනුමත කළේ :

**පී.ඒ. කොඩිප්පිලි**
**අධ්‍යක්ෂ (මුදල්) වෙනුවට**

**මහාචාර්ය ඩබ්ලිව්. එම්. අබේරත්න බණ්ඩාර**
**අධ්‍යක්ෂ ජනරාල්**

**2013 ජුනි 13**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**මහරගම**

ජාතික අධ්‍යාපන ආයතනය
මූල්‍ය කාර්යසාධන විස්තරය
2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | සටහන් | 2012 රු. ශත | 2011 රු. ශත |
|---|---|---|---|
| මෙහෙයුම් ආදායම් | | | |
| රජයේ සහ විදේශ වලින් ලත් පුනරාවර්තන ආදායම් | 14 | 237,277,355.00 | 269,258,193.05 |
| අනෙකුත් ආදායම් | 13/(15-20) | 204,172,680.81 | 252,097,124.24 |
| මුළු ආදායම | | 441,450,035.81 | 521,355,317.29 |
| මෙහෙයුම් වියදම් | | | |
| පුද්ගල පඩිනඩි | 21 | 198,649,554.31 | 200,200,769.42 |
| ගමන් වියදම් | 23 | 3,200,522.40 | 4,534,766.37 |
| සැපයීම් සහ පාරිභෝජන අවශ්‍යතා | 24 | 24,874,682.38 | 18,128,000.41 |
| නඩත්තු වියදම් | 25 | 17,454,848.92 | 24,240,440.57 |
| ගිවිසුම්ගත සේවා | 26 | 148,070,022.76 | 151,704,770.83 |
| තැන්පත් වියදම් | 26-1 | 17,117,849.95 | 25,606,817.52 |
| ක්ෂයවීම් හා වෙන් කිරීමේ වියදම් | 27 | 50,390,423.44 | 44,401,802.13 |
| මෙහෙයුම් වියදම් | 28 | 16,000,199.21 | 11,069,834.46 |
| මුළු මෙහෙයුම් වියදම් | | 475,758,103.37 | 479,887,201.71 |
| අතිරික්තය/(ඌනතාවය) මෙහෙයුම් ක්‍රියාවලියේ මූල්‍ය පිරිවැයට පෙර | | (34,308,067.56) | 41,468,115.58 |
| මූල්‍ය පිරිවැය | 29 | (318,790.00) | (390,000.00) |
| කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය (ඌනතාවය) | | (34,626,857.56) | 41,078,115.58 |

මූල්‍ය වාර්තාවන්ට අදාල ගණකාධිකරණ ප්‍රතිපත්ති හා සටහන් පිටු අංක 03 සිට 05 දක්වා අදාල වේ.

නිවැරදි බවට නිර්දේශ කළේ :

**පී.ඒ. කොඩිප්පිලි**
**අධ්‍යක්ෂ (මුදල්) වෙනුවට**

අනුමත කළේ :

**මහාචාර්ය ඩබ්ලිව්. එම්. අබේරත්න බණ්ඩාර**
**අධ්‍යක්ෂ ජනරාල්**

2013 ජුනි 13
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම.

## ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය

## 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | 2012<br>රු. ශ. | 2011<br>රු. ශ. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්** | | |
| (අතිරික්තය/ඌනතාවය) සාමාන්‍ය ක්‍රියාකාරකම් | (34,614,394.00) | 41,078,116 |
| **ගැලපීම්** | | |
| **මූල්‍ය නොවන ක්‍රියාකාරකම්** | | |
| ක්ෂයවීම් | 50,390,423.00 | 48,679,436 |
| සේවක පාරිතෝෂික සඳහා වෙන් කිරීම | 5,663,957.00 | 6,895,794 |
| අනිකුත් ගැලපීම් | 55,831,378.00 | (49,516,362) |
| **ක්‍රියාකාරී ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර මෙහෙයුම් ක්‍රියාකාරකම්** | **77,271,364.00** | **47,136,984** |
| තොගය වැඩිවීම්/(අඩුවීම්) | (24,305,957.00) | 2,415,719 |
| ලැබිය යුතු දෑවල (වැඩවීම්)/අඩුවීම් | (2,561,334.00) | (581,883) |
| අනෙකුත් ජංගම වත්කම්වල (වැඩිවීම්/අඩුවීම්) | (2,535,876.00) | (12,000,000) |
| ගෙවිය යුතු දෑවල වැඩිවීම්/(අඩුවීම්) | (15,501,935.00) | 24,193,692 |
| **ක්‍රියාකාර ප්‍රාග්ධනයෙන් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(44,905,102.00)** | **(93,972,472)** |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් | 32,366,262.00 | (46,835,488) |
| සේවක පාරිතෝෂික සඳහා ගෙවීම් පිරිවැය | 6,447,792.00 | (9,968,426) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල** | **38,814,054.00** | **(56,803,914)** |
| **ආයෝජිත ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රමාණය** | | |
| දේපල යන්ත්‍රසූත්‍ර හා පිරියත එකතු කිරීම් | (54,874,646.00) | (58,324,640) |
| **ආයෝජිත ක්‍රියාකාරකම් සඳහා යොදන ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(54,874,646.00)** | **(58,324,640)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රමාණය** | | |
| ප්‍රාග්ධන ප්‍රධාන හා පරිත්‍යාග | 493,400.00 | 59,299,023 |
| ණය අරමුදල | 2,547,677.00 | 2,458,995 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වල යෙදූ ශුද්ධ මුදල** | **3.041.077.00** | **61,758,018** |
| **ශුද්ධ වැඩිවීම්/(අඩුවීම්) මුදල් හා මුදල් සමාන දෑ** | **(13,019,515.00)** | **(53,370,536)** |
| මුදල් හා සමාන දෑ (වර්ෂ ආරම්භය) | 61,507,669.00 | 114,878,205 |
| **මුදල් හා සමාන දෑ (වර්ෂ අවසානයේ)** | **48,488,154.00** | **61,507,669** |